2018 ඔක්තෝබර්
01 කාණ්ඩය 11 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®

සටන් කරන තාරුණ්‍යයට



# CHE Guevara

# විලාසිතාවෙන් එහා ජීවිතය දැකීම!

ආදරය කියන්නේ මොකක්ද කියලා ඇහුවම මට මතක් වුනේ මගේ ගෙදර, නෑ. ඊටත් කලින් මගේ පෙම්වතියව. ඒත් ආදරය කියන්නේ ඒ බැම්මලට විතරක් ලඝු නොවුණු ඊට එහා ගිය එකක් කියලා මම දැනගත්තෙ උඹෙන්. අපි ජාති ආගම් ගැන කිය කියා කොල්ලො කෙල්ලො සෙට් පිරින් රංචු ගැහිලා මරාගන්නකොට, ජීවිතේට දැකලවත් නැති රටක් උඹම හොයාගෙන ගිහින් උදව් කළා. උඹ ආදරේ කළේ ඒ දුක්විඳින මිනිස්සුට. ජීවිතේ තරුණ කාලේ සල්ලි ටිකක් හම්බ කරන්, බජව්වක් දාන්, ෆුල් ආතල් එකේ ඉන්නවා වෙනුවට උඹ තෝරගත්තෙ ඒ මිනිස්සුන්ට උදව් කරන එක. උඹ ආදරේ කළේ මුළු ජීවිතේ පුරාවටම ජීවිතය හොයන, තමන්ගේ අවසන් හුස්ම පොදත් දහඩියත් මේ බිමට සමතලා කරන, වැඩ කරන මිනිස්සුන්ට. ඒ ආදරේ මේ මගේ හිතට මතක් වෙන, මට දැනුණ හැම ආදරයකටම වඩා උසස්!

අපි හැමෝම ඉගෙනගන්නේ දොස්තර කෙනෙක් වෙන්න; ඉංජිනේරුවෙක් වෙන්න. ඒත් මේ මාරාන්තික තරගයේදී කීයෙන් කී දෙනාටද ඒ ආසාව ජයගන්න පුළුවන්? ඇත්තටම අපි දොස්තර කෙනෙක් වෙන්න දඟලන්නෙ ලෙඩ්ඩු බේරගන්න තියෙන උවමනාවටම නෙවෙයි. ඒක තමයි මේ රටේ තියෙන ෂුවර්ම ජොබ් එක. පරම්පරාව පිටින්ම ගොඩයන ජොබ් එක. ඒත් වැඩිහරියක් තරුණ අපි, ඉගෙනගත්තත් නැතත් අපි ඔක්කොම වැටෙන්නෙ ජොබ්වල වරප්‍රසාද අහිමි වේටින් ලිස්ට් එකට. ඉතින් එහෙම ඉන්න ඕන නැති එකම ජොබ් එක තමයි ඒ! අපි ඒ සටනෙනුත් ෆේල්! ඒත් උඹ, උඹ දොස්තර කෙනෙක්! හැබැයි උඹ දොස්තර කෙනෙක් වුණේ පී.පී. කරලා ලෙඩ්ඩුන්ව පෝලිමේ තියන්න නෙවෙයි. රට රටවල ඉන්න ලෙඩ්ඩුන්ව හොයන් ගිහින් උඹ බෙහෙත් කළා. සත්තුන්ට වගේ සලකපු ලාදුරු රෝගීන්ට උඹ බෙහෙත් කළේ ආරක්ෂක කබායක්, අඩුම තරමේ අත්වැස්මක්වත් නැතුව. මේ ලෝකෙ යහපත් හෙට දවසක් වෙනුවෙන් උඹට කරන්න පුළුවන් මොනවද, අන්න ඒ දේ තෝරගන්න උඹ කිසිවිටෙකත් පැකිළුණේ නෑ. වෙද නළාව පැත්තකින් තියන උඹ ඒ වෙනුවට තුවක්කුව තෝරගන්නේනත් ඒකයි. ඔව්! ඒ තමයි උඹ! ඒ තමයි උඹේ ආදරය..!

ළඟ ඉන්න මිනිහව මරාගෙන හරි තනතුරුවල සැප ලෙවකන, තනතුරුවලට ලොල් මිනිස්සු පාලනේ කරන මේ වගේ රටක ජීවත් වෙන අපිට උඹ ගැන අහනකොටත් පුදුමයි. උඹ කියුබාවෙ මුදල් ඇමති. උඹ කියුබාවෙ කර්මාන්ත ඇමති. උඹ නායකයෙක් නුනත් උඹ කෑවෙ අනිත් සගයොත් එක්ක එකට පෝලිමේ ඉඳගෙන. කොයි තනතුරු දැරුවත් උඹත් උඹේ සගයින්ට අඹ යාළුවෙක් වුණා. අන්න ඒකයි උඹ කාටත් 'චේ' වුණේ. ජයග්‍රහණවලින් පස්සෙ ජයග්‍රහණයේ තමන්ගෙ පංගුව බදාගෙන, විවේකී සුවයෙන් ඉන්න තිබ්බ ඒ චාන්ස් එකත් අතෑරලා උඹ ආයෙත් වෙනත් රටකට යනවා, ඒ රටටත් ඒ ජයග්‍රහණ අරන් දෙන්න. අපි නම් එච්චර අමාරුවෙන් ලැබෙන චාන්ස් එකක් නැති කරගනියිද? ඒකත් දැකලවත් නැති මිනිස්සු වෙනුවෙන්. ඒත් උඹ ඒ හැම සැපක්ම අතෑරලා ආවා. උඹේ ඒ ආදරේ වෙනුවෙන්! දුක්විඳින මිනිස්සු වෙනුවෙන්!




උඹ වෛර කළා. හැබැයි අපි වගේ අපේම පංතියේ කෙල්ලෝ කොල්ලන්ට නෙවෙයි! දහසක් මිනිස්සුන්ට අපාදුක් උරුම කළ ඒ නරුමයින්ටයි උඹ වෛර කළේ. අහිංසක මිනිස්සුන්ගෙ ජීවිත තළලා මිරිකලා දාලා ලාභ පසුපස යන ඒ නරුම ධනවාදයට සහ අධිරාජ්‍යවාදයට විරෙහිවයි. ඔව්! උඹ වෛර කළා උන්ට. උඹේ ඒ වෛරය, උඹේ ආදරය වගේම ප්‍රබලයි... දරුණුයි! ඒත් අපි? අපි අපේ ජීවිත වළපල්ලට යන බව දැන දැනම ඒකට වගකියන්න ඕන. මිනිස්සුන්වම නැවත නැවතත් බලේට ගේනවා. උන්ව රකිනවා. උන්ට තවත් අපිව විනාශ කරන්න ඉඩදීලා බලාගෙන ඉන්නවා. අපේ රස්සාව, ජීවිතේ අහිමි වෙයි කියන බයට අපි කරබාගෙන ඉන්නකොට, උඹ ගිහින් වෙඩි උණ්ඩ ඉස්සරහ පපුව කෙළින් තියාගෙන ඒ නරුමයින්ව එළවලා දාන්න සටන් කරනවා. උන්ව බයෙන් තැතිගන්වනවා. ඒ අතින් උඹ ග්‍රේට්! දෙන දෙයක් කාලා වෙන දෙයක් බලන් හුල්ල හුල්ල ඉන්න අපි හරි නෝන්ජල් මිනිස්සු බන්!

ඒත් අපි හිතං ඉන්නවා අපි හරි වෙනස් ජාතියක් කියලා. උඹව ටී ෂර්ට් එකේ ගහගෙන, උඹ ඉන්න කැප් එකක් දාගෙන, උඹගේ ස්ටිකර් එකක් ගහපු වාහනේක නැගලා, අපිත් හෙන රැඩිකල් වගේ පේන්න ඉන්නවා. ඒත් අපේ හිත්? අපේ හිත්වල ඇත්තටම උඹ ඉන්නවද? අපි ඇත්තටම උඹව දැක්කද?

උඹව මරලා දාලා මේ ඔක්තෝම්බර් අට වෙනිදට අවුරුදු පනස් එකක් වෙනවා. එදාට මුළු ලෝකෙම උඹව සමරනවා. ඒත්... මේ ලෝකෙට එදාටත් වඩා උඹ වගේ උන්ව ඕනෙ වෙලාවක, එදාටත් වඩා අහිංසක මිනිස්සු තැලෙන පොඩිවෙන ලෝකෙක, උඹ වගේ යහපත් හෙටක් වෙනුවෙන් වැඩ කරන්න බලකෙරෙන ලෝකෙක, තරුණ අපි තවත් මෙහෙම නිහඬවම ඉන්නවද?

එදා ෆිදෙල් කියුබාවෙ දරුවන්ට කිව්වෙ ඔයාලා චේ වගේ වෙන්න කියලා. ඒ චේ හැම අතින්ම පිරිපුන් මිනිහෙක් නිසයි. ඉතින් චේව නිවැරදිව දැකලා, සමාජයට වෙනසක් අවශ්‍යම වෙලාවක චේගෙ ජීවිතෙන් ගන්න පුළුවන් හොඳම දේ අරන්, චේ වගේ හොඳ මිනිහෙක් වෙන එක අපේ හදවත්වල, අපේ ජීවිතවල විලාසිතාව කරගන්න පුළුවන්නම්... අන්න ඒක තමයි මේ වෙලාවෙ අපට කරන්න පුළුවන් වටිනම දේ!

## පොරොන්දු කඩ කළ ආණ්ඩුවක්!



අධ්‍යාපනයට ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන වෙන් නොකරන නිසා විශ්වවිද්‍යාලවල හා පාසල්වල අර්බුද රැසක් මතුවී ඇති බවත් ආණ්ඩුව රාජ්‍ය අධ්‍යාපනය බිඳ වට්ටවමින් හා අධ්‍යාපනය විකිණීමට කටයුතු කරමින් සිටින බවත් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා ප්‍රකාශ කර සිටියේය. ඔහු මේ බව ප්‍රකාශ කර සිටියේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පසුගිය සැප්තැම්බර් 27 දා පැවති මාධ්‍ය හමුවකදීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් ඔහු කියා සිටියේ තව මාසයකින් 2019 අයවැය ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බවත් වත්මන් ආණ්ඩුව පසුගිය අයවැය මඟින් අධ්‍යාපනය වෙනුවෙන් ලබාදුන් පොරොන්දු මෙතෙක් ඉටුකිරීමට අසමත් වී ඇති බවත්ය. එබැවින් පොරොන්දු පවා කඩකරමින් උපාධියත් මුදලට විකිණීමේ ක්‍රියාවලියකට අතගසා ඇති මෙම පාලනය පිළිබඳ සමස්ත ජනතාවම ඉදිරියේදී තීරණයක් ගනු ඇති බවද හෙතෙම සඳහන් කළේය.

## අධ්‍යාපන සමූපකාර පොදු සේවක සංගමයේ 7 වන වාර්ෂික සමුළුව



අධ්‍යාපන සමූපකාර පොදු සේවක සංගමයේ 7 වන වාර්ෂික සමුළුව සැප්තැම්බර් 25 දින කොළඹ, මහවැලි කේන්ද්‍රයේ දී පැවැත්විණි. ඒ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙනි. තවද ඒ සඳහා ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා, අධ්‍යාපන සමූපකාර පොදු සේවක සංගමයේ ලේකම් මොනිකා කණ්ඩම්බි මහත්මිය ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයින් රැසක් සහ දිස්ත්‍රික්ක ගණනාවක්ම නියෝජනය කරමින් සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක් ද සහභාගී වූහ.

## වරාය සේවක සමූපකාර බැංකුවෙන් විශ්වවිද්‍යාල සමත් සිසුන්ට ටැබ් පරිගණක



වරාය සේවක සමූපකාර බැංකුව විසින් සිය සාමාජිකයින්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලත් දරුවන් හට ටැබ් පරිගණක හා පොත් කට්ටල ලබා දීමේ උත්සවයක් සැප්තැම්බර් 16 වන දා මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වීය. මෙම වරාය සේවක සමූපකාරයේ බලය හිමිව ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන වරාය පොදු සේවක සමිතියටයි.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයා, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා, වරාය පොදු සේවක සමිතියේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා ඇතුළු වරාය සේවක සමූපකාර බැංකුවේ නිලධාරීන් ගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවති අතර විශ්වවිද්‍යාල වරම් ලැබූ සාමාජික සාමාජිකාවන්ගේ දූදරුවන් සහ දෙමව්පියන්ද ඊට එක්වූහ.

## ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ ආසියානු කලාපීය සමුළුව රැස් වේ




ලෝක වෘත්තීය සමිති සමුළුවට අනුබද්ධ ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ ආසියානු කලාපීය සමුළුව සැප්තැම්බර් 14 දින කොළඹ පදනම් ආයතනයේ දී පැවැත්වීය. එය ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් ජෝර්ජ් මව්රිකෝස් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර ඊට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත සහෝදරයා සහ ලෝක ගුරු වෘත්තීය සමිති සම්මේලනයේ ආසියානු කලාපීය උප සභාපති, ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ද සහභාගී වූහ. ඊට අමතරව මෙම සමුළුව සඳහා ඉන්දියාව, නේපාලය, කාම්බෝජය ඇතුළු රටවල් ගණනාවක විදෙස් නියෝජිතයින් රැසක් ද සහභාගී විය.

## වතු කම්කරුවන්ගේ අවම වැටුප රු.1281ක් කළ යුතුයි



වසර 200ක් තිස්සේ අන්ත දරිද්‍රතාවයෙන් දිවි ගෙවන වතු කම්කරුවන්ට අලුත් ජීවිතයක් ලබාදිය යුතු බවත් ඒ වෙනුවෙන් වූ එක් පියවරක් ලෙස අවම වැටුප රුපියල් 1281/-ක් කළ යුතු බවත් සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් ජේ. එම් ප්‍රේමරත්න සහෝදරයා පවසයි. පසුගිය සැප්තැම්බර් 19 දින පැවති මාධ්‍ය හමුවක් අතරතුරදී ඔහු මේ බව සඳහන් කළේය. වතු කම්කරු වැටුප් වැඩිකර ගැනීමේ සාමූහික ගිවිසුම් කාලය අවසන් වී ඇති බවත් නව සාමූහික ගිවිසුමක් සඳහා සාකච්ඡා පැවැත්වීමට සියලු පාර්ශවයන්ගෙන් ඉල්ලා ඇති බවත් තවදුරටත් අදහස් දක්වමින් ඔහු පැවසීය. එසේම සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කේ. සෙල්වරාජ් සහෝදරයා, උප ලේකම් කේ. කලයිවෙල්වි සහෝදරිය ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයින් රැසක් මෙයට සහභාගී වූහ.

# අලුත් සමාජයක් වෙනුවෙන් විකල්ප කලාවක් බිහිවිය යුතුයි



උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි සහෝදරයා

## මොකක්ද මේ දහදිය සිත්තම කියන්නේ?

මේ රටේ වැඩකරන ජනතාවගේ නිර්මාණ වෙනුවෙන් වන එකම කලා උළෙල කියලා කෙටියෙන් කියන්න පුළුවන්. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය මෙන්ම වතු ක්ෂේත්‍රය ද නියෝජනය කරන සමස්ත වැඩකරන ජනතාවගේම නිර්මාණ ඇගයීමට ලක් කරන තැන කිව්වොත් වඩාත් නිවැරදියි. නිෂ්පාදනයේ පදනම ශ්‍රමයයි. නිෂ්පාදනය වෙනුවෙන් ශ්‍රමය වගුරුවන මිනිසා නිෂ්පාදනය හා බැඳුණු තමාගේ ජීවන අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරන්න උත්සාහ කරනවා. සියලු කලාවන්හි උල්පත ශ්‍රමය කියලා කිව්වොත් ඒක නිවැරදියි. ඒ නිසා " සියලු කලාවන්හි උල්පත වූ ශ්‍රමයේ උරුමය සොයා පියනගන සෞන්දර්යාත්මක විකල්ප වේදිකාව" යන්න තේමාව ලෙස ගනිමින් පැවැත්වෙන වැඩකරන ජනතාවගේ කලා උළෙල තමයි "දහදිය සිත්තම"කියන්නේ.

## මෙවැනි කලා උළෙලක් පැවැත්වීමේ අරමුණ මොකක්ද?

පවතින ක්‍රමය විසින් අද අපේ රටේ ජනතාවට දියුණු සංස්කෘතික ජීවිතයක උරුමය අහිමි කරලා තියෙනවා. ඒ නිසා අපට සමාජමය වගකීමක් තියෙනවා, අහිමි කරලා තියෙන සංස්කෘතික ජීවිතයේ අයිතිය වෙනුවෙන් අරගලයක් කරන්න. මිනිස්සුන්ට රසඥතාව මෙන්ම බුද්ධිමය පරිකල්පනයක් ඇති කිරීමට හැකි විශිෂ්ට ඝනයේ නිර්මාණකරණයක අවශ්‍යතාවය අද රටට තියෙනවා. සමාජ සංවර්ධනය අපේක්ෂා කරන ප්‍රගතිශීලී කලා සාහිත්‍ය නිර්මාණ බිහිවීමේ අවශ්‍යතාවයක් තියෙනවා. ඒ උවමනාව අපේ රටේ සම්මත නිල කලාවෙන් හෝ සාහිත්‍යයෙන් ඉටුවෙන්නේ නැහැ. පවතින ක්‍රමය වෙනුවෙන් ආවඩන, ඒ වෙනුවෙන් දරදිය අදින සම්මත නිල කලාකරුවන්ගෙන් ඒක බලාපොරොත්තු වෙන්නත් බෑ. ඒ නිසා මේ සමාජය මීට වඩා ලස්සන කළ හැකි, වෙනස් කළ හැකි, මිනිස්කම අගයන, මිනිසුන්ට මිනිසුන්ගේ වටිනාකම දැනෙන අලුත් සමාජයක් වෙනුවෙන් වන විකල්ප කලාවක් අනිවාර්යයෙන්ම බිහිවිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ අරමුණින් කලා ක්ෂේත්‍රයේ සිටින සීමිත කලාකරුවන් ප්‍රමාණයකගේ දායකත්වයත් මගපෙන්වීමත් සහිතව, අලුත් සමාජයක් බිහි කළ හැකි, එවැනි සමාජයක් වෙනුවෙන් බලපෑමක් කළ හැකි, උසස් රසවින්දනයෙන් හා බුද්ධිමය පරිකල්පනයෙන් ඉහළ නිර්මාණ මෙන්ම නිර්මාණකරුවන් බිහිකිරීම වගේම එවන් නිර්මාණකරුවන්ට වේදිකාවක් තැනීම තමයි අපේ අරමුණ.

## වැඩබිමේ තරුණ තරුණියන්ට දහදිය සිත්තම වැදගත් වන්නේ ඇයි?

අද වැඩබිමේ සිටින ආධුනික නිර්මාණකරුවන්ට තමන්ගේ නිර්මාණ ඉදිරිපත් කරන්න තියෙන තැන් අඩුයි. තිබුණත් නිවැරදි හා අපක්ෂපාතී ඇගයීමක් ලැබෙන ජාතික මට්ටමේ වේදිකාවක් නැහැ. ඒ වගේම එවැනි නිර්මාණකරුවන් සොයායමින් ඔවුන්ට ධෛර්යයක් දෙන්න වැඩපිළිවෙළක් පවා නැහැ. දහදිය සිත්තම නිසා වැඩබිමේ සිටින තරුණ තරුණියන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අද කලා ක්ෂේත්‍රයේ විවිධ මට්ටම්වල තම නිර්මාණ කටයුතුත් සමඟ ඉදිරියට යමින් ඉන්නවා.

## මෙවර දහදිය සිත්තමේ සූදානම කොයි වගේද?

මෙවර දහදිය සිත්තම දින දෙකක උළෙලක් ලෙස පවත්වන්නයි සාහිත්‍ය අනු කමිටුව ලෙස කටයුතු සූදානම් කරමින් තිබෙන්නේ. කෙටි නාට්‍ය, කෙටිකතා, කාව්‍ය රචනා, ගීත රචනා, ප්‍රකාශන චිත්‍ර, පෝස්ටර් චිත්‍ර, ඡායාරූප, ජංගම දුරකථන කෙටි චිත්‍රපට ආදී තරඟ අංශ ගණනාවකින් මේ වන විටත් නිර්මාණ කැඳවා අවසන්ව තිබෙනවා. දැන් එම අංශවල නිර්මාණ අවසන් වටයේ විනිශ්චය මට්ටමේ පවතිනවා. අවසන් විනිශ්චයෙන් ඇගයීමට ලක්වන නිර්මාණකරුවන් වෙනුවෙන් ඇගයීමේ උළෙල ඉදිරියේදී පැවැත්වීමට කටයුතු සූදානම් කරලායි තියෙන්නේ.

## දහදිය සිත්තම අවසන් දින දෙක පිළිබඳවත් යමක් කිව්වොත්?

එය 2018 ඔක්තෝම්බර් මාසේ 26 සහ 27 දෙදින පුරා බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් තිබෙනවා. උළෙලේ පළමු දිනයේ දී ජංගම දුරකථන කෙටි චිත්‍රපට උළෙලත්, කෙටි නාට්‍ය උළෙලත් ප්‍රධාන අංග ලෙස පවත්වනවා. දෙවැනි දිනයේ දී ජාත්‍යන්තර සාහිත්‍යධරයන්ගේ සහභාගීත්වයෙන් කලා සාහිත්‍යය ක්‍රියාකාරකම් කීපයක්ම සිද්ධ කරන්නත් නියමිතයි. ඒ වගේම එදින රටේ ප්‍රවීණ චිත්‍ර ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් ළමා, තරුණ, වැඩිහිටි පිරිස් සඳහා චිත්‍ර ඇඳීම, මූර්ති නිර්මාණය කිරීම ඇතුළු කලා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් රැසක් ද සිදු කිරීමට නියමිතයි. ජයග්‍රාහී නිර්මාණ ඇගයීමේ කටයුත්ත වගේම ප්‍රවීණ, ප්‍රගතිශීලී කලාකරුවන්ගේ දායකත්වය සහිතව සංස්කෘතික උළෙල හා ප්‍රසංගයක් පැවැත්වීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අපි ආරාධනා කරනවා මේ රටේ කලාකාමී තරුණ තරුණියන් සියලු දෙනාටම මේ අත්දැකීම විඳගන්න එන්න කියලා.

## මේ අතර වැඩබිමේ කරන අරගලය නැවතිලාද?

කිසිසේත්ම නෑ. වැඩබිමේ අරගලයේදීත් ඉදිරියෙන්ම ඉන්නේ ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානය හා ඊට අනුබද්ධ වෘත්තීය සමිතියි. විශේෂයෙන්ම අලුතෙන් රාජ්‍ය සේවයට බැඳෙන තරුණ තරුණියන්ට හිමිවිය යුතු විශ්‍රාම වැටුප් අයිතිය පාලකයින් විසින් කොල්ලකාපු එකට එරෙහිව ඒ අයිතිය නැවත දිනාගන්න අපි අරගල කරනවා. පෞද්ගලික අංශයේ අර්ථසාධක අරමුදල් කොල්ලකන්න පැවති ආණ්ඩුව වගේම පවතින ආණ්ඩුවත් පිඹුරුපත් සකස් කරමින් සිටිනවා. නමුත් අර්ථසාධක අරමුදලේ මුදල් කියන්නේ පෞද්ගලික අංශයේ මෙන්ම අර්ධ රාජ්‍ය අංශයේ වැඩකරන ජනතාවට අයිති ඒවා. පෞද්ගලික අංශයේ විශාල තරුණ තරුණියන් ප්‍රමාණයක් රැකියා කරනවා. ඒ අයගේ සල්ලි තමයි ආණ්ඩුව මේ විදියට හොරකම් කරන්න හදන්නේ ඒ නිසා මෙවැනි කාරණාවලට එරෙහිව වැඩබිමේ කෙරෙන අරගලය අඛණ්ඩව සිදුවෙනවා.

> පෞද්ගලික අංශයේ අර්ථසාධක අරමුදල් කොල්ල කන්න පැවති ආණ්ඩුව වගේම පවතින ආණ්ඩුවත් පිඹුරුපත් සකස් කරමින් සිටිනවා.

## රුපියල් 10,000/- කින් වැටුප් වැඩි කර තිබියදීත් ඇයි ඉතින් මේ පඩි වැඩි කරන්න කියලා ඉල්ලන්නේ?

ආණ්ඩුව රුපියල් දහදාහකින් පඩි වැඩි කළේ 2015 දියි. ඒ එවකට තිබුණු ජීවන වියදම් තත්ත්වය අනුවයි. නමුත් 2015 පෙබරවාරි ඉඳලා 2018 ජූලි වන විට ජීවන අංකය 17.6 කින් ඉහළ ගිහිල්ලා. ඒ අනුව ආණ්ඩුවම පිළිගන්නා ආකාරයට හතර දෙනෙක්ගෙන් යුත් පවුලකට ජීවත් වෙන්න අවශ්‍ය මූලික බඩු මල්ල ලබාගන්නත් මේ රටේ වැඩකරන ජනතාවට වැටුප් වැඩිවීමක් අනිවාර්යයෙන්ම කළ යුතුයි. ඒ නිසා තමයි ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානය ලෙස එය නිවැරදිව සංඛ්‍යාත්මකව ගණන් බලලා තියෙන්නේ 2015 පෙබරවාරි වන විට ජීවන අංකය 108.9 යි. 2018 ජූලි වෙද්දි ඒක 126.5 ක් වෙලා. වැඩිවීමේ පරතරය 17.6ක් වුනේ එහෙමයි. ජීවන අංකයක මූල්‍ය වටිනාකම රුපියල් 321 යි. ඒ අනුව ආණ්ඩුව මේ රටේ වැඩකරන ජනතාවට රුපියල් 5649.60කින් වැටුප් වැඩිකළ යුතුයි. ඒකයි අපේ ස්ථාවරය.

## වැටුප් සටනේ ඉදිරි ක්‍රියාමාර්ග කොයි වගේද?

වැඩබිම් දැනුවත් කිරීම්, වැඩකරන ජනතා පෙත්සම් අත්සන් කිරීම් ඇතුළු ක්‍රියාමාර්ග රැසක් මේ වනවිටත් ආරම්භ කරලා තියෙනවා. ඉදිරියේදී සමස්ත වැඩකරන ජනතාවම සම්බන්ධ කරගනිමින් ජීවන වියදමට සරිලන ලෙස ජීවත් වීමට සාධාරණ වැටුපක් ඉල්ලලා රටපුරා දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමින් උද්ඝෝෂණ ක්‍රියාමාර්ග දියත් කරන්නත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය ලෙස කටයුතු සූදානම් කරමින් පවතිනවා. ඒ වගේම ඉදිරි අයවැයෙන් හෝ ඊට පෙර ආණ්ඩුව මේ රටේ වැඩකරන ජනතාවට ජීවත් වීමට සරිලන වැටුපක් ලබා දිය යුතුයි. ආණ්ඩුව මේ කරන හොරකම්, නාස්තිකාර වියදම්, වංචා දූෂණ නතර කරලා මේ රටේ වැඩකරන පංතිය ඇතුළු සමස්ත ජනතාවටම සහන ලබාදිය යුතුව තියෙනවා. ඒ අරමුණින් අපි අපේ සටන අඛණ්ඩව ඉදිරියට ගෙනියනවා.

# වැඩිඩන් මුණගස්වන වෙබ් අඩවි

අප පසුගිය ලිපියෙන් කථා කරනු ලැබුවේ අන්තර්ජාලයෙන් මුදල් සෙවීම සත්‍යයක්ද යන්නයි. මෙවර ලිපියෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ එවැනි ආකාරයට මුදල් සෙවිය හැකි ක්‍රම නොමැති නම් වෙබ් අඩවි කිහිපයක් පිළිබඳවයි.

නිවසේ සිටම අන්තර්ජාලය හරහා මුදල් ඉපයීම සඳහා බොහෝ පිරිසක් විසින් භාවිතා කරනු ලබන්නේ සේවාවන් සැපයීමයි. එනම් තම හැකියාවන් අලෙවි කිරීමයි. උදාහරණයක් ලෙස තමන්ට වෙබ් අඩවි නිර්මාණය සම්බන්ධව දැනුමක් තිබේනම් එම දැනුම භාවිතා කරමින් දේශීයව හෝ විදේශීයව එම සේවාව අවශ්‍ය පුද්ගලයින්ට හෝ ආයතනයට වෙබ් අඩවි නිර්මාණය කරදීම සිදු කරයි.

මෙහිදී සෘජුවම තම සේවාවන් සේවාලාභියාට අලෙවි කිරීම තරමක් සංකීර්ණ කාර්යයකි. ඒ සඳහා විවිධ ප්‍රචාරක මාධ්‍යයන් භාවිතා කරමින් තම සේවාව ප්‍රචර්ධනය කළ යුතුය. එසේම ඒ සඳහා අධික පිරිවැයක්ද දැරිය යුතුය. මෙයට පිළියමක් ලෙස විවිධ ආයතන මඟින් සේවා සපයන්නන් සහ සේවාලාභීන් මුණගැසීමට සලස්වන වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් නිර්මාණය කර දී ඇත. සියලුම ප්‍රචාරක කටයුතු, මුදල් ගනුදෙනු, නීතිමය කටයුතු මෙන්ම තවත් අවශ්‍ය බොහෝ දේ මෙම වෙබ් අඩවි මඟින් සිදුකර දෙනු ලබයි. මේ සඳහා ඔවුන් ඒ එක් එක් සේවාවට ලැබෙන මුදලින් යම්කිසි මුදලක් කොමිස් ලෙස අයකරගනු ලබයි.



මෙවැනි ආකාරයේ ඇති වෙබ් අඩවි විශාල ප්‍රමාණයක් අතරින් මෑත කාලයේ ජනප්‍රියම සහ පහසුවෙන් හැසිරවිය හැකි වෙබ් අඩවි කිහිපයක් හඳුනාගත හැකිය.

Fiverr, oDesk, Elance, Freelancer

ඔබටත් ඉහත වෙබ් අඩවියක ලියාපදිංචි වී ඔබගේ සේවාවන්වල විස්තර සහ නිදර්ශන ඇතුළත් කර profile එකක් පවත්වාගෙන යා හැකිය. ඒ සඳහා කිසිදු මුදලක් ඔබෙන් අය නොකරයි. ඔබට අවශ්‍ය වන්නේ අලෙවි කිරීමට යම් සේවාවක් පමණි.

අප මින් එක් වෙබ් අඩවියක් පිළිබඳ විමසා බලමු. Fiverr යනු දැනට ලෝකයේ භාවිතා වන වඩාත් ජනප්‍රිය සේවා සපයන වෙබ් අඩවියකි. www.Fiverr.com යන ලිපිනයෙන් මෙම වෙබ් අඩවියට පිවිසීමට ඔබටත් හැකිය. එයින් සේවා විකිණීම මෙන්ම ලබාගැනීමද කළ හැකිය. ඒ අනුව ලාංඡන, ඡායාරූප, පොත් පිටකවර, වෙබ්අඩවි, සංගීත ඛණ්ඩ, භාණ්ඩ ඇසුරුම්, සඟරා හා වීඩියෝපට නිර්මාණය මෙන්ම වෙබ් අඩවි සඳහා ලිපි ලිවීම, විවිධ භාෂා සඳහා පරිවර්තන ලබා දීම, ඊමේල් මාර්කටින් සහ කාටූන් නිර්මාණය වැනි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තම හැකියාවන් අලෙවි කොට මුදලක් ලබා ගත හැකිය. මෙහි සේවාවන්හි ගාස්තු අමෙරිකානු ඩොලර් 5කින් ආරම්භ වේ. ඔබ ලබන මුදලින් සියයට 20ක මුදලක් මෙම වෙබ් අඩවිය මඟින් රඳවා තබා ගනියි.

ඉතාම කුඩා වේලාවකින් මෙම වෙබ් අඩවියේ ලියාපදිංචිය ලබාගත හැකි අතර ඔබ පිළිබඳ හැඳින්වීමක් මෙන්ම ඔබගේ නිදර්ශන සහ එක් එක් කාර්යයට අදාළ විස්තරයක් ලබා දෙමින් සේවා අලෙවිය ආරම්භ කළ හැකිය. මෙහිදී පළමුවෙන්ම ඔබගේ හැකියාව ඔබ හඳුනාගත යුතුය. එමෙන්ම එයට අදාළ මෘදුකාංග හැසිරවීම පිළිබඳවද ඔබට මනා පළපුරුද්දක් තිබිය යුතුය. බොහෝවිට මෙහිදී මුණගැසෙනුයේ විදේශිකයින් වන බැවින් ඉංග්‍රිසි භාෂාව හැසිරවීම පිළිබඳවද අවබෝධයක් තිබීම වැදගත්ය.

තම හැකියාව මත මෙම වෙබ් අඩවිය තුළ සේවාවන් අලෙවි කිරීමෙන් මාසිකව මුදල් ඉපයිය හැකිය. සේවාලාභීන් විසින් ඔබේ සේවාව මත ඔබට ශ්‍රේණිගත කිරීමක් ලබාදෙනු ඇත. ඒවා මඟින් ඔබව මෙම වෙබ් අඩවිය තුළ තහවුරු කෙරෙනු ඇත. ඒ මඟින් ඔබගේ සේවා වටිනාකම ඉහළ දමමින් ඔබ උපයන මුදල් ප්‍රමාණයද ඉහළ දමා ගත හැකිය. සේවාව ලබා ගත් අය සෑහීමකට පත් වූයේ නම් නැවත නැවතත් ඔවුන් විසින් ඔබවම සොයා පැමිණෙනු ඇත.

ඉතින් පළමුව ඔබගේ හැකියාව හඳුනාගෙන Fiverr වෙබ් අඩවියේ ලියාපදිංචි වී සේවා සැපයීම ආරම්භ කරන්න.

අප මෙම ලිපියෙන් මඟපෙන්වීමක් පමණක් කරනු ලබන බැවින් වෙබ් අඩවිවල ලියාපදිංචි වීමේ සිට සියලු දේවල් සාකච්ඡා නොකරන අතර ඒ සම්බන්ධයෙන් ඔබට යම් ගැටලුවක් මතුවූයේ නම් ඒ පිළිබඳව අපගේ ඊමේල් ලිපිනය ඔස්සේ විස්තර දැනගත හැකිය.

මෙවැනි තවත් වෙබ් අඩවියක් පිළිබඳ ඉදිරි ලිපියෙන් විමසමු.



සටහන:
ප්‍රියන්ත දිසානායක

අපගේ ඊමේල් ලිපිනය
Email: syuforwardnews@gmail.com

# මේ ආණ්ඩුව හිස කඳින් වෙන්වුණු ආණ්ඩුවක්

**බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුවේ කැඳවුම්කරු මහේෂ් අබේපිටිය**

රැකියා ලබාදීමේදී බාහිර උපාධිධාරීන් නොසලකා හැර කටයුතු කිරීමට එරෙහිව පසුගිය කාලය තුළ විශාල කතාබහක් ඇති වුනා. එහිදී බාහිර උපාධි සුරැකීම වෙනුවෙන් විවිධ පාර්ශව සිය හඬ අවදි කරන්න පටන්ගත්තා. ඒ නිසාම අපි මේ පිළිබඳව විස්තර දැනගන්න බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුවේ කැඳවුම්කරු මහේෂ් අබේපිටිය සහෝදරයාව සම්බන්ධ කරගත්තා?

## බාහිර උපාධිය පිළිබඳ සද්දෙ ආයෙත් ඇහෙන්න පටන් අරගෙන. ඒ ඇයි?

බාහිර උපාධිය පිළිබඳ සද්දෙ ආයෙත් පටන් ගන්න අපට සිද්ධ වුණා. ඒ සද්දෙ නිකන් ඇහෙන එකක් නෙමෙයි. අපි බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුව විදිහට මේ සද්දෙ පටන්ගත්තෙ මීට බොහෝම ඉස්සර. ඔබට මතක ඇති 2016/13 චක්‍රලේඛය ගෙනාපු වෙලාවෙ බාහිර උපාධියක් ලබාගන්න ශිෂ්‍යයින්ට තිබුණු අවම අවස්ථාවත් නැති කරලා දාන්න උත්සාහ කළා. අපි ඒකට විරුද්ධව නැගීහිටියා, සටන් කළා. අපි විසිරිලා හිටපු ශිෂ්‍යයෝ සංවිධානය කළා. ඒ සටන අපිට ජයග්‍රහණය කරන්න පුළුවන් වුණා. චක්‍රලේඛ, නීති රීතිවලින් කරගන්න බැරිවෙච්ච බාහිර උපාධිය අහෝසි කිරීමේ ක්‍රියාවලිය දැන් මේ ගොල්ලෝ පටන් අරගෙන තියෙනවා, අලුත් විදියකට කරන්න. ඒකයි මේ සද්දෙ.

## මොකක්ද ආණ්ඩුව පටන් අරගෙන තියෙන අලුත් විදිහ?

ඒක තමයි බාහිර උපාධි අවසන් කරපු ශිෂ්‍යයින්, තමන්ට උපාධිය ලබාගත්තට පස්සේ රැකියාවක් ලබා ගැනීමට යාමේ දී ආණ්ඩුව ඔවුන්ට වෙනස් කොට සැලකීම. ඒ විතරක් නෙවෙයි, ඒ හරහා තවදුරටත් බාහිර උපාධිය ඉගෙන ගන්න ශිෂ්‍යයින්ව දුර්වල කිරීම, ඔවුන් අපහසුතාවයට පත් කිරීම, ඉගෙනගන්න බලාපොරොත්තුවෙන් ඉන්න අයගේ බලාපොරොත්තු සුන් කිරීම. උපාධිධාරීන් රාජ්‍ය සේවට බඳවා ගැනීමේ අවම වයස් සීමාව 35ක් කරලා තියෙනවා? මේ හරහාත් බාහිර උපාධියට ස්වභාවික මරණයක් අත්කරලා දෙන්නයි මොවුන්ගේ සූදානම. මේ ආණ්ඩුව හදනවා නම් බාහිර උපාධියට ස්වභාවික මරණයක් අත් කරලා දෙන්න, අපි සූදානම් මේ ආණ්ඩුවට අස්වාභාවික හා ඉක්මන් මරණයක් ලබාදෙන්න.



## හීනෙන් බයවුනා වගේ සටන් කරන්න පුළුවන්ද?

අපි හීනෙන් බයවුණා වගේ නෙමෙයි මේ සටනට බැස්සේ. කලින් කීවා වගේම මේ සටනේ අපි මුල ඉඳලම හිටියා. අපි හොඳ අවබෝධයෙන් හිටියා, කොයි මොහොතක හෝ බාහිර උපාධිය අහෝසි කිරීම වෙනුවෙන් මේ ආණ්ඩුව ක්‍රියාමාර්ගයන් තෝරන බවට. ඒකෙ එක පියවරක් තමයි මේ තියලා තියෙන්නේ. මේ යහපාලන ආණ්ඩුව හිතන්න ඇති මොනයම් හෝ මොහොතක සමාජයේ ඇස් වහලා වැඩේ කරන්න. ඒගොල්ලෝ තමා හීනෙන් බය වෙලා තියෙන්නේ. අපි මේ සටන කරන්නේ හොඳට හිතලා, හොඳට තේරුම් අරගෙන, සංවිධානාත්මකවයි. අපි මේ වෙනකොට ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම බාහිර උපාධිධාරීන් එකතු කරමින් ඉන්නවා. අපි ඊළඟ වටයේ පටන් ගන්නවා බාහිර උපාධි අධ්‍යනය කරන සිසුන් එකතුකරන්න. ඉන්පසු අපි පටන් ගන්නවා, මුළු සමාජයම මේ වෙනුවෙන් දැනුවත් කරන්න. අපි සූදානමින් ඉන්නේ අවශ්‍යනම් මුළු රටම එක්කාසු කරලා දැවැන්ත සටනක් කරන්න. ඒ නිසා අපි කියන්න කැමතියි මේ ආණ්ඩුවට, අපි හීනෙන් බයවෙලා නෙමෙයි මේ සටන කරන්නේ කියලා.

## තනියෙන්ද මේ සටන කරන්නේ?

නැහැ. මේ සටන කරන්න අපි බොහෝ සංවිධාන සමඟ සාකච්ඡා කළා. මීට පෙර 2016/13 චක්‍රලේඛනය අහෝසි කරන්නත් මේ රටේ හිටපු සංවිධාන 16 ක් අපි එකතු කරගත්තා. ඒ නිසා මේ සටන පටන් අරගෙන තියෙන්නෙත් එහෙම. විශේෂයෙන්ම මේ සඳහා අපි එකතු කරගෙන තියෙනවා බාහිර උපාධිය වෙනුවෙන් පෙනී සිටින විශේෂ සංවිධාන කිහිපයක්. ඒ අනුව බාහිර උපාධි ශිෂ්‍ය බලමණ්ඩය, බාහිර උපාධි ආචාර්ය සංසදය, බාහිර උපාධි සුරැකීමේ දෙමාපිය සංසදය, ලංකා ගුරුසේවා සංගමය, මහේෂ් විමුක්ති සහෝදරයාගේ 14 පිටුවට

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# භාවිතයෙන් තරුණයන් වෙමු

සමාජයේ කොතනට ගියත් අසන්නට ලැබෙන ප්‍රශ්න රැසකි. තාරුණ්‍යය පිළිබඳව ද එසේමය. "තරුණයෝ හරිම කම්මැලියි, කිසිම වැඩක් පිළිවෙළකට කරන්න බැහැ, සංස්කෘතියක්, සදාචාරයක් නෑ, අම්මා, තාත්තා, අඳුරන්නේ නෑ, අරක්කු, සිගරට් තමයි ජීවිතේ වෙලා තියෙන්නේ, කොයි වෙලාවේ බැලුවත් ෆෝන් එකේමයි" ආදී ලෙස තරුණයන් පිළිබඳ නරක ආකල්ප රැසක් සමාජය තුළ ගොඩගසා ඇත. ඒ වගේම මුළුමහත් සමාජයමත් පිරිහිලාය යන අදහසින් ද සමාජය පිරී තිබේ. ඉඳින් එවැනි සමාජයක් තුළ ජීවත් වන තරුණයා පමණක් සුබිත මුදිත විය නොහැකිය. පැණි වරකා ගහට හෙණ ගැසූ පසු අනිත්වා ගැන කවර කතාද? ඒ නිසා තරුණයා පමණක් ඉන් බේරී සිටිය යුතුයැයි තර්ක කිරීමම මිනිසාට තරම් නොවේ.

පිරිහී ජරාජීර්ණ වුණු සමාජයක වුවද එය වෙනස් කිරීමට තරම් ධෛර්යය සම්පන්න තරුණයින් අත්‍යාවශ්‍යය. එසේ නොමැතිව එම නරා වළේම වැටී මියයෑම තාරුණ්‍යයට උචිත නොවේ. තරුණයා විප්ලවකාරී වන්නේ සමාජය යහපත් ලෙස වෙනස් කිරීමට දරන උත්සාහය මතයි. පවතින ධනවාදී සමාජය තුළ සියල්ල කෙළෙසෙයි. එහෙත් ධනවාදයේ නරුම බව පමණක් තවදුරටත් පවත්වාගෙන යයි. ලෝක ඉතිහාසය පුරාවටම එවැනි සමාජ ක්‍රමයන් වෙනස් කරන්නට වෙර දරනු ලැබුවේ තරුණයින්ය. ඊට ලෝක පරිමාණයේ ආදර්ශය චේය. චේ තාරුණ්‍යයේ සදාකාලික සංකේතය වනුයේ එබැවිනි. සටන්කාමීත්වයේ, නායකත්වයේ, අසාධාරණයට හා අයුක්තියට එරෙහිව නැගීසිටීමේ, මානවවාදීත්වයේ, මෙන්ම විලාසිතාවේ ද තාරුණ්‍යයේ ද ආදර්ශය වනුයේත් චේය.

එහෙත් අප චේගෙන් ලබාගන්නේ මොනවාද? අප ඔහුගේ විලාසිතාව සහ පෙනුම පමණක් උරුම කරගෙන සිටී. විලාසිතාවෙන් එපිට හදවතෙන් හෝ බුද්ධියෙන් හෝ චේව ඉවත දමා ඇත. ඒ නිසා අද පටන් අපි චේගෙන් ඉගෙන ගනිමු. අසාධාරණයට, අයුක්තියට, පීඩනයට එරෙහිව සටන් කරන්නට උගනිමු. මානවවාදියෙකු ලෙස සිතන්නට උගනිමු. මිථ්‍යාවෙන් හා ජාතිවාදයෙන් අන්ධ නොවීමට උගනිමු. ආත්මාර්ථකාමීත්වයෙන් අත්මිදෙන්නට උගනිමු. බලාපොරොත්තු හා අරමුණු බිඳවැටුණු විට පවා නැගී සිටින්නට උගනිමු. කිසිවකින් හෝ බිඳනොවැටී ඉන්නට උගනිමු. සමස්ත මානව සමාජයටම ආදරය බෙදන්නට උගනිමු. සැකෙවින්ම පැවසුවහොත් මුළු සමාජ ක්‍රමයම යහපත් ලෙස වෙනස් කරන්නට ඉගෙන ගනිමු.

මේ සමාජය වෙනස් කිරීම තරුණ අපගේ වගකීමකි. ඒ සඳහා පියවරක් හෝ ඉදිරියට තැබිය යුතුය. චේද මේ සමාජ ක්‍රමය වෙනස් කිරීමට පියවරක් නොව ගව්ගණනාවක්ම ඉදිරියට තැබුවෙකි. ජීවත් වුණු චේට වඩා මියගිය චේ, තරුණයන් අතර සදාදරණීය වූයේ එ බැවිණි. ඉඳින් චේ වැන්නවුන් දස දහස් ගණනින් ඇවැසි මේ මොහොතේ දී තරුණ ඔබත් චේ ගේ ආදර්ශයන්ගෙන් ඉගෙනගෙන, ජීවිතය නැවත කියවිය යුතුය. භාවිතයෙන්ම චේ වැනි අයෙක් විය යුතුය.

### සැප්තැම්බර් 05

## 20 පාර්ලිමේන්තුවට



20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව පසුගිය කාලය පුරාම වැඩි වැඩියෙන් කතාබහකට ලක් විය. ජනතා විමුක්ති පෙරමුණ විසින් යෝජනා කර ඇති එම සංශෝධනය පිළිබඳ පක්ෂව හා විපක්ෂව විවිධ දේශපාලන පක්ෂ විසින් විවිධ ඉඟි පළකර තිබුණි. පාර්ලිමේන්තුව තුළ යෝජනාවක් ලෙස සම්මත වීමේදී යම් කෙනෙක් ඊට විරුද්ධ වුවහොත් එය නැවත ඉදිරිපත් කිරීමට නම් 20 දෙනෙකුගේ ඡන්ද ලබා ගැනීම අනිවාර්යය. කල්යල් බලමින් නිසි වේලාවට ජවිපෙ පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස, එහි ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා විසින් 20 වන සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර එහිදී එය යෝජනාවක් ලෙස සම්මත විය. දැන් කළ යුත්තේ ජනතාවට වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් නිර්මාණය කෙරෙන මෙම 20 වන සංශෝධනය පිළිබඳ රටේ දැවැන්ත මහජන මතයක් ගොඩනගමින් එය ජයග්‍රහණය කරා රැගෙන යාමයි.

### සැප්තැම්බර් 17

## සියල්ල අයාලේ ගිය රටක..

"සියල්ල අයාලේ ගිය රටක ක්‍රිකට් විතරක් අයාලේ නොයයිද?" යනුවෙන් සඳහන් වූ අපූරු පෝස්ටුවක් බුකිය තුළ සැරිසරන්නට විය. ඒ 2018 ආසියානු කුසලාන තරඟාවලියේ දී පැවැති තරඟයකදී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ඇෆ්ගනිස්ථානයට පරාජය වීමත් සමඟයි. කොහොම නමුත් පවතින ධනවාදය තුළ සියලු දේ විනාශ වී යන විට ක්‍රීඩාව පමණක් යෙහෙන් වැජඹෙන්නේ කෙසේද? එසේනම් අප මේ මුළු සිස්ටම් එකම වෙනස් කළ යුතු නොවේද?

### සැප්තැම්බර් 23

## පාර්ලිමේන්තුවේ ජවිපෙ ඉදිරියෙන්ම

පාර්ලිමේන්තුවේ සක්‍රීයම මන්ත්‍රීවරයා ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයා බව දැක්වූ පෝස්ට් කිහිපයක්ම බුකිය පුරා හුවමාරු වෙනු දක්නට තිබුණි. මෙරට පාර්ලිමේන්තුව සම්බන්ධව සමීක්ෂණයේ යෙදෙන manthri.lk වෙබ් අඩවිය විසින් පාර්ලිමේන්තුවේ සක්‍රීයම මන්ත්‍රීවරු පිළිබඳ කළ සමීක්ෂණ වාර්තාවක් පසුගියදා නිකුත් කළේය. එහි සක්‍රීයම මන්ත්‍රීවරු දස දෙනා අතර ජවිපෙ මන්ත්‍රීවරු හතර දෙනෙක් සිටින අතර එහි එක දෙක හා



තුන යන ස්ථාන ත්‍රිත්වයම හිමිව ඇත්තේ ජවිපෙටයි. පළමු ස්ථානය ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයා වන අතර දෙවැනි හා තුන්වැනි ස්ථාන පිළිවෙළින් නලින්ද ජයතිස්ස සහ බිමල් රත්නායක සහෝදරවරුන් විසින් දිනාගෙන තිබුණි. මේ අතර සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාද 5 වන ස්ථානය හිමි කරගෙන ඇත.

### සැප්තැම්බර් 26

## බාහිරේට යළිත් බහිරවයා




බාහිර උපාධිධාරීන්ගේ රැකියා කප්පාදුවට එරෙහිව පැවැති විරෝධතා ව්‍යාපාරයක් හා මානව හිමිකම් පැමිණිල්ලක් භාරදීම සම්බන්ධව පෝස්ට් බුකිය පුරා දකින්නට ලැබුණි. එම විරෝධතාවය මානව හිමිකම් කාර්යාලය ඉදිරිපිට දී බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුව විසින් සංවිධානය කර තිබුණි. පසුගියදාක ආණ්ඩුව විසින් තෝරාගත් උපාධිධාරීන් 4035ක් සඳහා රාජ්‍ය ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා පත්වීම් ලබාදී තිබුණි. නමුත් එහිදී බාහිර උපාධිධාරීන්ගේ පත්වීම් අවලංගු කර ඇති බව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් ඔවුන් වෙත ලිපි මඟින් දැනුම් දී තිබුණි. එබැවින් ඊට එරෙහිව මෙම විරෝධතාවය සිදුකෙරුණි. විශ්වවිද්‍යාලයට යා නොහැකි හා අඩු ආදයම් ලබන ශිෂ්‍යයින් බොහොමයක් බාහිර උපාධි පාඨමාලාව හදාරනු ලබයි. නමුත් අවසන වත්මන් යහපාලන ආණ්ඩුවද සැරසෙන්නේ ඔවුන්ගේ එකම සිහිනයත් බිඳදැමීමට බව පැහැදිලි වේ. එම නිසා ඉදිරියේදී බාහිර උපාධිධාරීන්ට මෙන්ම බාහිර උපාධි ශිෂ්‍යයින්ට ද තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් විශාල අරගලයක් කිරීමට සිදුවන කාලයක් එළඹෙනු ඇත.

### සැප්තැම්බර් 27

## පිදුරංගල කලබැගෑනිය හා ආණ්ඩුවේ මගෝඩි වැඩ



අද වැඩිදෙනෙකුගේ අවධානය යොමු වී තිබුණේ පිදුරංගල ගල මුදුනේ සිට තම පක්ෂාගතය පෙන්වමින් ඡායාරූප ලබාගත් බවට සැක කෙරෙන තරුණයින්ගෙන් තිදෙනෙක් අත්අඩංගුවට පත් වීම ගැනයි. අදාළ සිදුවීම සම්බන්ධයෙන් කිසිවෙකුටත් නැවත නැවතත් කීම අවශ්‍ය නොවේ. එහෙත් මේ හරහා සමාජය තුළ කතා කරන්නට තවත් අලුත් මාතෘකාවක් ලැබී තිබුණි. ඒ අතර බොහෝ අය පැවසූයේ තරුණයින්ගේ එම ක්‍රියාවෙන් මෙරට සංස්කෘතියට මරු පහරක් එල්ල වූ බවයි. නමුත් සංස්කෘතිය යනු පරෙස්සමට, පුළුල්ව තේරුම් බේරුම් කරගත යුත්තකි.

කෙසේ වුවත් අප මේ සංස්කෘතික කතා බහ තුළට ගාල් වන අතරේ රටේ තවත් බොහෝ දේ වෙනස් වී තිබුණි. ඒවා පිදුරංගල කොල්ලන්ගේ පක්ෂාගාතයට වඩා අපි කාගේත් ජීවිතවලට බලපෑමක් කරන දේවල්ය. ගෑස් මිල රුපියල් 195කින් ඉහළ ගියේය. ඊළඟ වසරේ රජයේ වියදම් තවත් කෝටි 30,000කින් ඉහළ දමාගෙන තිබුණි.

ඉතින් අපට ඇසීමට ඇත්තේ මෙපමණකි. අප සැබෑවටම පස්ස හැරවිය යුත්තේ ජනතාවට බඩේ පාර දෙන මේ ආණ්ඩුවලට නොවේද?

# බාල්දිය සිංගප්පූරුවට දී ළිඳට පැනීම නොහොත්
# සිංගප්පූරු - ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම

මෙරට ජනතාවටත් පාර්ලිමේන්තුවටත් හොර රහසේ අත්සන් කළ සිංගප්පූරු - ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම 2018 මැයි මස 01 වන දා සිට ක්‍රියාත්මකය. මේ වසරේ ජනවාරි 23 දින අත්සන් කළ මෙම ගිවිසුම පිළිබඳව තවමත් ප්‍රමාණවත් තරමේ සමාජ කතිකාවක් ගොඩනැගී නොමැත. එහෙත් සැබවින්ම මෙම නීති විරෝධී හොර වෙළඳ ගිවිසුම පිළිබඳව අප කවුරුත් යම් පමණකින් හෝ දැන සිටීම අතිශය වැදගත් වනු ඇති.

නම් කරන ලද භාණ්ඩ හා සේවා විශාල ප්‍රමාණයකට අදාළව ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර පොදු වෙළඳ පොළක් නිර්මාණය කිරීම මෙම ගිවිසුමෙහි ප්‍රකාශිත අරමුණයි. එහෙත් එම ගිවිසුමට අනුව

★ ශ්‍රී ලංකාව රටක් වෙනුවට නිදහස් වෙළඳ කලාපයක් බවට පරිවර්තනය වේ.

★ ආරම්භයේදීම භාණ්ඩ වර්ග 3500කට පමණ ද, ක්‍රමානුකූලව තවත් භාණ්ඩ වර්ග 3500කට පමණද ආනයන බදු නිදහස් කෙරේ.

★ මූල්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, සෞඛ්‍යය, නීති, උපදේශන හා ශ්‍රමික ආදී සේවා ක්ෂේත්‍ර ගණනාවක් සඳහා මැදිහත් වීමට පුද්ගලයින්ට සහ සමාගම්වලට ඉඩකඩ නිර්මාණය කෙරේ.

★ ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සම්මුතීන් ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අදාළ වටපිටාව නිර්මාණය කර තිබේ.


කෙසේ වුවද මෙම ගිවිසුම පිළිබඳව හොඳ හා නරක අදහස් රාශියක් සමාජය තුළ තැන්පත්ව ඇතත් අප කවුරුත් එහි ගුණ අගුණ හොඳින් කිරාමැන බැලීම අත්‍යාවශ්‍ය වනු ඇති.

යහපාලන ආණ්ඩුව විසින් මෙම ගිවිසුම විග්‍රහ කරමින් කියා සිටින්නේ බදුවලින් නිදහස් කරන ලද පොදු වෙළ ඳපොළක් නිර්මාණය කිරීම නිසා මෙරටට ආයෝජන ගලා එන බව හා එමඟින් මෙරට ආර්ථිකය වර්ධනය වනු ඇති බවයි. එසේම එයින් ජනතාවට පහසුවෙන්ම භාණ්ඩ මිලදී ගැනීමේ අවස්ථාවද උදාවනු ඇති බවයි. එහෙත් ඔය කියන ආකාරයේ සීනිබෝල ලාබ ප්‍රයෝජන සැබෑවටම ලැබෙන්නේ දැයි අප විමසා බැලිය යුතුය.

මෙරට ආර්ථිකයේ නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි පවතින සැබෑම තත්වය ගැන කිසියම්ම හෝ අවබෝධයක් අප කාටත් තිබේ. සැබවින්ම සාපේක්ෂ වශයෙන් ගත් කල අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය ඇත්තේ ඉතා අවම මට්ටමකයි. කොටින්ම කිවහොත් සමාජවාදී කඳවුරේ රටවලින් පරිත්‍යාග ලෙස අප රටට ලැබුණු බොහෝ කර්මාන්තශාලා පවා 1977 න් පසුව පැවති විවෘත ආර්ථිකය තුළ ඇදගෙන ගියේ විනාශය කරායි. අද ඒ බොහෝ කර්මාන්තශාලා එක්කෝ විකුණා තිබේ. නැතහොත් විකිණීමට දතකමින් තිබේ. එසේම කෘෂිකාර්මික ක්ෂේත්‍රය පවා යම් පමණකට පැවතියත් එයද ලෝක මට්ටමේ තරඟකාරීත්වයකට ළඟා විය නොහැකි, නවීන තාක්ෂණය හිඟ ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ. ඒ අනුව ගත් කළ මෙරට නිෂ්පාදන ආර්ථිකයක් පවා නොමැති තරම්ය. ඉදින් ප්‍රමාණවත් තරමේ නිෂ්පාදනයක් නොමැතිව අප, රට පටවන්නේ මොනවාදැයි අපම කල්පනා කර බැලිය යුතුය. ඒ හැරත් එවන් තත්වයක් යටතේ භාණ්ඩ වර්ග 7000කට ආසන්න ප්‍රමාණයක් බදුවලින් නිදහස් කර මෙරටට ආනයනය කිරීමට ඉඩ දීම තුළ තවදුරටත් මෙරට පැවති අවම නිෂ්පාදනයට පවා කණකොකා හඬනු නැතැයි කාටනම් කිව හැකිද? සරලවම කියන්නේ නම් සිංගප්පූරු වෙළඳ පොළේ භාණ්ඩවලට කරට කර තරඟ කිරීමට අපේ රටේ භාණ්ඩවලට සිදුවේ. එහෙත් අපගේ හැකියාව කොතෙක්දැයි කියා හොඳින්ම දැන දැනත් මෙවැනි අභියෝගයකට මුහුණ දීම යනු මෙරට දේශීය නිෂ්පාදකයාව තව තවත් වළපල්ලට ඇද දැමීමක් වනු නොඅනුමානය. එසේම අපේ රටට සෘජුවම අදාළ වන අපට ආවේණික නිෂ්පාදන වන වී, පොල්, කුරුඳු, ගම්මිරිස්, වැනිලා, කරාබු, ඉඟුරු, කිතුල් හකුරු හා කිතුල් නිෂ්පාදන, ආයුර්වේද නිෂ්පාදන මෙන්ම තීන්ත නිෂ්පාදන ආදී මේ සියල්ලම කෙටිකාල සීමාවක් තුළ බදු පැනවීමකින් තොරවම රට තුළට ආනයනය කිරීමට ඉඩ සලසා තිබේ. ඒ අනුව යන්තමින් හෝ කෙරෙන මෙරට නිෂ්පාදන සියල්ලම පාහේ බිඳවැටීම අනිවාර්යයකි.

මෙහි තිබෙන තවත් බරපතලම කරුණක් වන්නේ කැළිකසළ ගෙන ඒම සඳහාද බදු නිදහස් කිරීමයි. ඒ අනුව නාගරික අපද්‍රව්‍ය, මළ අපවහන, සායනික අපද්‍රව්‍ය, ඖෂධ අපද්‍රව්‍ය, න්‍යෂ්ටික අපද්‍රව්‍ය ආදී වශයෙන් කසළ වර්ග 70ක් පමණ නම් කර තිබේ. අවසානයේදී ආසියාවේ මුතු ඇටය ආසියාවේ කුණු කූඩය බවට පත්වීමට ගතවන්නේ ඉතා කුඩා නිමේෂයකි.

අනික් අතට නිෂ්පාදන ක්ෂේත්‍රයේ මෙන්ම සේවා අංශයේදී බරපතල දෙදරා යාමක් සිදුවනු නියතය. මූල්‍ය, අධ්‍යාපන හා ප්‍රවාහන ආදී සියලුම ආකාරයේ සේවාවන් පිටතින් සැපයීමට ඉඩදීම තුළ මෙරට ශ්‍රමිකයින්ගේ රැකියා අවදානම ඉතා ඉහළ මට්ටමකට ගෙනයනු ඇත්තේය.




**හොරාට අත්සන් කළ ගිවිසුමක්**

**මුළු රටම නිදහස් වෙළඳ කලාපයක් වෙයි**

**භාණ්ඩ වර්ග 7000ක ආනයන බදු නිදහස්**

**මුතු ඇටය - කුණු කූඩයක් වෙයි**

ඉදින් රටේ ආර්ථිකයට මෙතරම් දැවැන්ත බලපෑමක් ඇතිකරනු ලබන මෙම ගිවිසුම පාර්ලිමේන්තුවේ කිසිඳු අනුමැතියකින් තොරව අත්සන් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි වගන්තිය උල්ලංඝණය කිරීමකි. ඊට අමතරව 2018 මාර්තු මස 09 දා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී සම්මත කරගත් පනත් 02ක්, ශ්‍රී ලංකාව විසින් පිළිගනු ලබන බව ඊට මාස 02කට පෙර ජනවාරියේදී අත්සන් කළ මෙම සිංගප්පූරු ගිවිසුමේ අන්තර්ගතව තිබීම ද බරපතල සැකයක් උපදවයි. මෙතරම් වංචාසහගත ලෙස මෙම ගිවිසුම සකස්කොට අත්සන් කරනු ලැබූයේ පළාත් පාලන මැතිවරණයෙන් රට උණුසුම්ව තිබූ සමයක කාටත් හොර රහසේය.

මංගල සමරවීරලා, රනිල් වික්‍රමසිංහලා සහ මලික් සමරවික්‍රමලාට අවැසිව ඇත්තේ "නව වෙළඳ ප්‍රතිපත්ති" ලෙස හුවා දක්වමින් මෙරට ආර්ථික ලිබරල්කරණයට අවශ්‍ය මාර්ගය විවර කරදීම බවනම් සක්සුදක් සේ පැහැදිලිය. එසේම විදේශීය බලවතුන් කෙරෙහි මෙරට ආර්ථිකය සූදුපොළක් බවට පත්කොට දී අපේ රට තවදුරටත් ඔවුන්ගේ බලය පැතිරවිය හැකි නිදහස් වෙළඳ කලාපයක් බවට පත්කිරීමයි. තවදුරටත් පවසන්නේ නම් විවෘත ආර්ථිකයේ නිර්මාතෘවරුන් වන ඇමරිකා එක්සත් ජනපදය පවා වර්තමානයේ දී ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරද්දී ශ්‍රී ලංකාවේ ආර්ථික ඔස්තාර්ලා විසින් මෙරට වෙළඳපොළ මුළුමනින්ම විවෘත කිරීම යනු ලොමුඩැහැ ගැන්වෙන විහිළුවක්ම වන්නේය.

මේ රටේ වගකිව යුතු ජනතාවක් ලෙස අප මේ ගිවිසුම ගැන තවතවත් අධ්‍යයනය කළ යුතුව ඇත්තේ එම නිසාය. එයින්ද නොනැවතී අප

★රටට හතුරු මෙම හොර ගිවිසුම හකුළා ගැනීමට ආණ්ඩුවට බලකර සිටිය යුතුය.

★දේශීය කර්මාන්ත, රැකියා අනතුරට හෙළන සිංගප්පූරු - ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම පරාජය කිරීමට පෙළගැසිය යුතුය.

# වෙනසක මාරුතයට අතවැනූ තාරුණ්‍යයේ කථාව






"ඔයා සාගින්නේ පෙළෙන, යුක්තිය ඉටුනොවන, සූරාකෑමට ලක්වුණු අය වෙනුවෙන් නැගී සිටිනවා නම්, ඔයාගේ හදවත වගේම ලේත් ඔවුන් වෙනුවෙන් දෙන්න. එතකොට එයාලා ඔයාට "සහෝදරයා" කියා අමතාවි මුළු හදවතින්ම."

ඔව් සහෝදරයා නිතැතින්ම එලෙස අමතාවි ඔබව. ඔවුන් ඔබෙන් අපේක්ෂා කරන යුක්තිගරුක බව, සාධාරණත්වය හා කැපවීම ඔබ සතු වූ විට සැබවින්ම ඔවුන් එලෙස අමතාවි. නමුත් ඔබ එලෙස සමාජ සාධාරණත්වය වෙනුවෙන් කටයුතු නොකරන තාක් ඔවුන් ඔබට එසේ අමතන්නට තැත් නොදරාවි.

ඉඳින් මලයාලම් චිත්‍රපටයක් වන "සඛාවු" හි ද "සහෝදර ක්‍රිෂ්ණන්" තම ජීවිතයම කැපකළේ අන් කවරක් වෙනුවෙන් නොව, සූරාකෑමට ලක් වූ ජනතාවට සාධාරණත්වය ඉටුකිරීම සඳහාමය.

"ඉපදුණු මුල්ම තත්පරේ පටන්ම අපි දේශපාලනයේ කොටස්කරුවෝ"

බව පවසමින් තම ජීවිතයම දේශපාලනය වෙනුවෙන් කැපකළ ඔහු, සමාජ සාධාරණත්වය වෙනුවෙන් තම දිවියෙන් පවා වන්දි ගෙවීමට පසුබට නොවූවෙකි. එසේම ජනතාව වෙනුවෙන් තම හදවතේ උපන් අසීමිත ආදරය නිර්ලෝභීව බෙදාහළ ඔහු වෙනුවෙන්ද පෙරළා අසීමිතව ආදරය පුදකරන්නට තරම් ජනතාව ඉදිරිපත් වූ අවස්ථාද බොහෝය.

සහෝදර ක්‍රිෂ්ණන් විටෙක විප්ලවවාදී පක්ෂයක ක්‍රියාකාරිකයෙකු ලෙස ද, තවත් විටෙක හොඳ සැමියෙකු ලෙස ද, තවත් විටෙක ආදර්ශමත් පියෙකු ලෙසද තම භූමිකාවන් පෙළෙගැස්වූ අතර යමක අවසානය දක්වාම කිසිවිටෙකත් අත්නොහැර කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව කියාදුන් සොඳුරු මිනිසෙක්ද විය.

නමුත් චිත්‍රපටය තුළ සිටින "ක්‍රිෂ්ණකුමාර්" යනු තම පුද්ගලික අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීම සඳහා පොරබදමින් සිටි අයෙකි. ඔහු තමාට ලැබෙන ධනය හා බලය වෙනුවෙන් තවත් පුද්ගලයෙකුගේ ජීවිතය වුව නසා දැමීමට තරම් පහත් මානසිකත්වයකින් පෙළුනේය. ඒ නිසාවෙන්ම සැබෑ ලෙසම " සහෝදරයා" යන්න ඔහුට තවදුරටත් ඉතා දුරස්ථ හැඟීමක් විය.

නමුත් අහඹුවකින් සහෝදර ක්‍රිෂ්ණන්ගේ ජීවන කතාව ඇසූ ඔහු තමන් කටයුතු කරන්නේ කෙතරම් පටු අරමුණක් වෙනුවෙන් ද යන වග අවබෝධ කරගනී. එසේම සහෝදර ක්‍රිෂ්ණන් වෙත ජනතාව දක්වන අසීමිත ආදරය නිසා ඔහුට කිසිදිනෙක නොමැරෙන පුද්ගලයෙකු ලෙස ජීවමානව නැගී සිටින්නට තරම් හැකියාවක් ඇති බව ක්‍රිෂ්ණකුමාර් දුටුවේය. අවසන එවැනි ආදරයක් ලබන පුද්ගලයෙකු වන්නට ක්‍රිෂ්ණකුමාර් තුළ ද පෙළඹවීමක් ඇති වේ.

"ඔයාට පුළුවන් ක්‍රිෂ්ණන් කියන කෙනාව මරන්න විතරයි. ඒත් සහෝදරයාව මරන්න කවදාවත් බෑ"

පුද්ගලයින් වෙනුවට ප්‍රතිපත්ති හා අරමුණු මත ජීවත් වන්නේනම් එම පුද්ගලයාව මරා දැමුවද කිසි දිනෙකවත් ඔහුගේ හෝ ඇයගේ අදහස් මරා දැමිය නොහැකිය. එසේම කෙතරම් බාධක පැමිණිය ද තම අරමුණු ජයගැනීම සඳහා කටයුතු කළ යුතු බවත්, එම අභියෝග හා බාධක මැඩගෙන ඉදිරියට යාමට අවශ්‍ය ශක්තිය තාරුණ්‍යය සතු බවත් සහෝදර ක්‍රිෂ්ණන්ගේ චරිතය තුළින් වඩාත් ඔප්නංවන්නට උත්සහ කොට තිබේ.

"මේ වයස ඉල්ලන්නේ වෙනසක මාරුතයයි."

හැමවිටම වෙනස් වීමට අවැසි වටපිටාව සකසා ගැනීමට තැත්දරන්නේ තාරුණ්‍යයයි. ඊට අවශ්‍ය බලපෑම සිදුවන්නේද අප අවට සමාජ වටපිටාව තුළින්ම බව පසක් කිරීමට නිර්මාණකරුවා විසින් ගෙන ඇති සෞන්දර්යාත්මක උත්සාහය ඉතා අගේය.

මිනිසෙකුට තවත් මිනිසෙක් උදෙසා කළ හැකි බලපෑම මෙතෙකැයි කිව නොහැකිය. ඊට හොඳම නිදසුන වන්නේ ක්‍රිෂ්ණකුමාර් තම ජීවිතයේ පැහැදිලි පරිවර්තනයක්, එක් දිනක් තුළ සිදුකරගැනීමයි. එවැනි පරිවර්තනයක් සිදුකර ගැනීමට තරම් සහෝදර ක්‍රිෂ්ණන් විසින් තම ජීවිත පොත අර්ථවත් ලෙස ලියා තිබිණි.

බලය හා ධනය ඉපයීම උදෙසා දේශපාලනයට පිවිසිය යුතු යැයි සම්මත මතයක එල්බගෙන සිටින ක්‍රිෂ්ණකුමාර් ඒ වෙනුවට සමාජයේ සිටින පීඩිත ජනතාවගේ ජීවිත ගොඩනැංවීම උදෙසා කටයුතු කිරීමට අදිටන් කරයි. ඒ අනුව යමින් ඔහු සමාජය වෙනස් කිරීම සඳහා දේශපාලන කටයුතුවල නිරත විය යුතු බව අවබෝධ කරගත් අතර ඒ සඳහා සැබෑ කොමියුනිස්ට්වාදී අදහස්වලින් තම හදවත පුරවාලීය.

"කොමියුනිස්ට් අදහස් කියන්නේ හරියට ගින්දර වගේ, ගිනිකූරු මත තැබුවොත් සූරාකන ධනේෂ්වර පංතිය බය වේවි.."

සැබවින්ම දුගී බවේ පීඩාවේ හා සමාජ අසාධාරණයේ වේදනාවේ ගිනි උහුලන මිනිස් ජීවිත වඩාත් සුවපත් කරනු හැක්කේ ද එලෙස ගින්දර සේ ධෛර්යයෙන්, වේගයෙන් හා ජවයෙන් පැතිරී යන අදහස් සහිත මිනිසුන්ට පමණී. SAKHAVU අපට කියාදෙන්නේ එයයි.

## සරදියෙල්ගේ කොලම

ඩොලරය උඩ යනවා. රුපියල පා වෙනවා. තෙමෙන්නැතිව යන්න වාහන ගන්න හිටපු අයගේ හීනේ තව ටිකක් බොඳ වෙනවා. අපේ අක්කලා නංගිලාගේ සනීපාරක්ෂාවටත් බදු ගහනවා. මැච් පරදිනවා. ඇන්ජලෝ එළවමු කියනවා. මැච් එක පැරදුණාම නායකයා එළවන්න කතා කරන රටේ ගොබ්ලෝ අවුරුදු 70 ක් තිස්සේ රට පරද්දපු නායකයෝ ඉස්සරහා දෙකට නැමෙනවා. අරක්කු ටිකකට, බත් පාර්සලේට තමන්ගේ මුළු ජීවිතේම පාවා දෙනවා.

සරදියෙල් පරපුරේ කොල්ලෝ කෙල්ලෝ මේ රටේ ඉන්නේ ටිකයි. එහෙව් කොල්ලෙකුට ඊයේ පෙරේදා ලේ පිළිකාවක් හැදුණා. සරදියෙල්ටත් සෑහෙන්න දුකයි. නමට සුවපති වෙච්ච පරාජිත මොනවා කිව්වත් පිළිකා රෝහලට ගියාම, දොස්තරලා බෙහෙත් නැහැ කියනවා. සල්ලිවලට ගෙනත් දෙන්න පුළුවන්නම් ලියලා දෙන්නම් කියනවා. ගොඩක් වෙලාවට ඒ ලියන ඒවා ගෙනැත් දෙන්න නම් දවසකට දාහේ කොළ පනහක් විතර ඕනි වෙනවා. අනේ ඉතින් කොල්ලගේ පවුලේ උදවිය දස අතේ දුව දුවා සල්ලි හොයනවා. පිළිකාව නියත වශයෙන්ම හොඳ කරන්න බෙහෙත් තාමත් හොයාගෙන නැතිලු. ලෝකේ බුද්ධිමත්ම සතා වෙච්ච මනුසතාට ඇයි තාම ඒ වගේ දේකටවත් උත්තර හොයාගන්න බැරි වෙලා තියෙන්නේ?

පොඩි කාලේ ඉඳන්ම ආත්මාර්ථකාමීව සල්ලි පස්සේ හඹාගෙන යන්න ඉගැන්නුවම, උන් දන්නේ තමන්ගේ පහසුව සලසා ගන්න විතරයි. ලෝකයේ පැවැත්ම ගැන හිතන්නේ නැහැ. අනෙකාට හෙණ ගැහුවත් කමක් නෑ තමන්ට හරි ගිහිල්ලා. තමා හිසට තම අතමය සෙවණැල්ල. එහෙමයි පොඩි කාලේ ඉඳන් ඉගැන්නුවේ. මුං එකෙක්වත් දන්නෑ අනෙකා නැතුව තනියෙන් රජ වෙලා පැවැත්මක් නැහැ කියලා.

ඉණිමගේ අඩි කීපයක් උඩට නැග්ගම ඔලුව ඉදිමෙනවා. යට ඉන්න උන්ට පාට් එක දානවා. ඉණිමග අල්ලන් ඉන්නේ යට ඉන්න උන් කියලා අමතක වෙනවා. යට උන්ට බඩේ පාර වදිද්දී හිනාවෙනවා. ඒත් උන්ට එහෙම වුනාට පස්සේ තමන්ටත් වෙන්නේ ඒ ටිකමයි කියලා දැනගද්දි පෙරහැර ගිහින්. හැබැයි වේලාසනින්ම මේ සන්තෑසිය තේරුම් අරන්, වේලාසනින්ම අවදිවෙච්ච බුද්ධිමත් ෟැචි එකක් හෂධ කියලා සංවිධානයක් පටන් අරන් තියෙනවා. මිනිස්සු දැනුවත් කරන්න පටන් අරන් තියෙනවා. ඉතින් රජෝ මේ පාරවත් තේරුම් ගත්තොත් තාවකාලිකව එකෙක් දෙන්නෙක්ට නෙවෙයි හැමෝටම වසන්තය උදා වෙනවා, සත්තයි!

නූතන සරදියෙල්

# පරිසරය වනසන "කටුපොල්" මාරයා



ලන්දේසීන් විසින් කටුපොල් ශාකය වාණිජ වගාවක් ලෙස 1948 දී ජාවා දූපත්වලට හඳුන්වා දී තිබේ. කටුපොල් ශාකයේ ස්වභාවික නිජබිම් ලෙස හඳුන්වන්නේ බටහිර හා නිරිතදිග අප්‍රිකානු රටවල්ය. වසර 2021 වන විට ලෝකයේ කටුපොල් වෙළඳ පොළ ඩොලර් බිලියන 65.7 සිට ඩොලර් බිලියන 92.8 දක්වා වර්ධනය වන බව හඳුනාගෙන තිබෙයි. එබැවින් එම වෙළඳ පොළ අත්පත්කර ගැනීමේ ප්‍රබල සටනක නිරත බහු ජාතික සමාගම් විසින් තම වගා භූමි ප්‍රමාණය ශීඝ්‍රයෙන් පුළුල් කරගනිමින් සිටියි.

කටුපොල් ශාකය නිවර්තන කලාපීය ශාකයක් වන මුත් එය වාණිජ වගාවක් ලෙස ස්ථාපිත කිරීමේදී ගැටලු බොහොමයක් පැන නගියි. භූගත ජලය අහිමි වීම, පාංශු ඛාදනය උග්‍ර වීම, ජල උල්පත් සිඳීයාම, තෙත් පරිසර පද්ධති වියළී යාම ආදිය ඉන් ප්‍රධාන වෙයි.

කටුපොල් වගා භූමිවල පස, යටි වගාවකින් තොරව නිරාවරණය කර තිබේ. එසේම ශාක අතර පරතරය ද වැඩිය. මේ හේතුවෙන් නිරිතදිග මෝසම් සුළං හා අන්තර් මෝසම් සුළං මඟින් වැඩි වර්ෂාපතනයක් ලබන තෙත් කලාපයේ පිහිටි මෙම වගාභූමි තුළ අධික පාංශු ඛාදන තත්වයක් නිසැකවම ඇතිවේ. මෙම වගාබිම් වෙත පතිත වන වැසි ජලය එහි මතුපිට පස් තට්ටුව සෝදා පාළු කරමින් පස මතුපිටින් වේගයෙන් ගමන් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස ජලය පොළවට උරා නොගන්නා අතර භූගත ජල සංචිත රැස්වීමද සිදු නොවෙයි. එසේම දිය උල්පත් සක්‍රීය වීමක් ද සිදු නොවන අතරම වැසි කාලයේ දී සිදුවන උග්‍ර පාංශු ඛාදනය හේතුවෙන් ජල මාර්ග රොන් මඩින් පිරී යයි. වැසි රහිත කාලගුණයක් පවතින විට දී පවා මෙම වගාබිම් වෙත ලැබෙන සූර්ය තාපය පස මතුපිටට පතිත වීමෙන් පසේ රැඳී පවතින සුළු ජල පරිමාවද පහසුවෙන්ම වාෂ්පීකරණයට ලක්වෙයි. ඊට අමතරව ශාක උත්ස්වේදන ක්‍රියාවලිය මඟින් ද පස ශීඝ්‍රයෙන් වියළී යයි. ඒ අනුව උල්පත් සිඳීයාම ද වේගවත් වෙයි.



අවසන කටුපොල් වගා බිම් අවට ජීවත් වන ජනතාවට උග්‍ර ජල අර්බුදයක් ඇතිකරන අතර එම ජල මාර්ගවල ජීවත් වන ජලජ ජීවීන්ගේ පැවැත්මට ද අහිතකර තත්වයන් ඇතිකරයි. තෙත් කලාපයේ ජල මූලාශ්‍ර සිඳීයාමට කටුපොල් වගාව ඍජුවම හේතුවන අතර එම ජල මූලාශ්‍රයන්හි පවතින ලංකාවට පමණක් ආවේණික ජලජ ශාක වන අතිඋඩයන්, කොටල හා කෙකටිය වැනි ශාක විශේෂ මෙන්ම ජලජ ජීවීන් වන මිරිදිය මත්ස්‍ය විශේෂ, මිරිදිය ඉස්සන්, මිරිදිය කකුළුවන් හා මිරිදිය බෙල්ලන් විශේෂ ආදී සතුන් බොහොමයක් වඳවීමේ තර්ජනයකට පවා ලක් වී ඇත. මීට අමතරව මෙම ප්‍රදේශයන්හි සිදුකෙරෙන සුළු පරිමාණ තේ වගාවට ද මෙම තත්වය ඉතාම හානිකර වේ. ලංකාවේ තෙත් කලාපයේ පමණක් නොව වියළි කලාපයේ මහවැලි ගඟ ආශ්‍රිත පිටාර තැනි වන කන්දකාඩුව ප්‍රදේශයේද කටුපොල් වගා කිරීමට මරීනා සමාගමට අවස්ථාව ලබාදීමට පසුගිය කාලයේදී පිඹුරුපත් සැකසිණි.


ජාත්‍යන්තර ග්‍රීන් පීස් සංවිධානය (Green Peace International) විසින් කටුපොල් ශාකය හඳුන්වනු ලබන්නේ "කුරිරු බවේ සංකේතය" නමිනි. මෙලෙස කටුපොල් වගාව පරිසරයේ පැවැත්මට දැඩි බලපෑම් එල්ල කරන වගාවක් බව හඳුනාගෙන තිබියදීත් ඒ පිළිබඳව අවධානයකින් තොරව මෙරට වාණිජ වගාවක් ලෙස ව්‍යාප්ත කිරීමට රාජ්‍ය අනුග්‍රහය පවා ලබාදීම ප්‍රධාන ගැටලුවකි. පසුගිය රජය සමයේ ඉන්දුනීසියාවේ කෘෂිකර්ම ඇමති සමඟ එවකට පැවති රජයේ වැවිලි කර්මාන්ත ඇමති මහින්ද සමරසිංහ මහතා විසින් ගිවිසුම්ගත වී ඇත්තේ මෙරට තෙත් කලාපයේ සරුසාර වගාබිම් කටුපොල් වගාවන් බවට පරිවර්තනය කරන බවටය. ඉන්දුනීසියාවේ පවා වනාන්තර ඇතුළු ස්වාභාවික සම්පත් හා ජෛව ප්‍රජාව ද කටුපොල් වගාවෙන් සහමුලින්ම වනසා දමා තිබෙන අවස්ථාවක මෙරට තෙත් කලාපයද එම අවදානමේ ගොදුරක් බවට පත්කිරීම සාහසික අපරාධයකි.

පළමු වරට මෙරට කටුපොල් වගාව ආරම්භ කළේ යුරෝපීය වැවිලිකරුවකු වන Jerry wales විසිනි. 1968 දී වටවල වැවිලි සමාගමට අයත් නාකියාදෙණිය වතු යායේ හෙක්ටයාර භාගයක භූමියක් පුරා ගස් 68ක් සිටුවමින් මෙරට පළමු කටුපොල් වගාව ආරම්භ විය. අදවන විට ලංකාවේ විශාලතම කටුපොල් වගාවේ හිමිකාරීත්වය දරන්නේ ද වටවල වැවිලි සමාග මය. එය හෙක්ටයාර 3157කි. තවද නමුනුකුල වැවිලි සමාගමට අයත් හෙක්ටයාර 2041කි, ඇල්පිටිය වැවිලි සමාගමට අයත් හෙක්ටයාර 1311 ක්, කෑගල්ල වැවිලි සමාගමට අයත් හෙක්ටයාර 1125ක් හා බගවන්තලාව වැවිලි සමාගමට අයත් හෙක්ටයාර 700ක් ලෙස ලංකාවේ කටුපොල් වගාබිම් හි ව්‍යාප්තිය හෙක්ටයාර 10000 ක් පමණ වේ. රජයේ අරමුණ එම ප්‍රමාණය හෙක්ටයාර 20000 ක් දක්වා වර්ධනය කිරීමයි. නමුත් කටුපොල් වගාවෙන් ජන දිවියට, ජලයට හා ජෛව ප්‍රජාවට සිදුකරන අහිතකර බලපෑම් පිළිබඳව මෙම වගා බිම් ව්‍යාප්ත කිරීමට ප්‍රථම කිසිඳු අවධානයක් යොමු කිරීමට රජය අපොහොසත්ව ඇත.

ජනතාවගේ සරුසාර වගාබිම් අහිමි කරමින්, පාරිසරික සමතුලිතතාවය බිඳිමින්, ජලජ ජෛව පද්ධතිය විශාල අවධානමක හෙළමින්, වාණිජ පරමාර්ථයන් මත ගනු ලබන මෙවැනි අදූරදර්ශී තීන්දු තීරණ හේතුවෙන් රටේ පරිසර පද්ධතියත් ජන ජීවිතයත් විනාශ මුඛයට ඇදයනු ඇත. පරිසර ඇමතිවරයා ලෙස පරිසරය පිළිබඳවත් ජනාධිපතිවරයා ලෙස ජන ජීවිතය පිළිබඳවත් තීන්දු තීරණ ගන්නා එක් පුද්ගලයෙකු සිටින අවදියකදී පවා මෙම කොටස් දෙකම අවදානමක හෙළන මෙවැනි තීන්දු තීරණ ගැනීමත් ක්‍රියාත්මක කිරීමත් පිළිබඳව ජනතාවට නම් ඇත්තේ මහා අපුලජනක හැඟීමකි.

The Gadget

# ICESat – 2 හොරාගේ අම්මගෙන් පේන ඇසීමක්ද ?



ICESat – 2 හි මෙහෙයුම් විද්‍යාඥ ටොම් වැග්නර් විසින් පසුගිය අගෝස්තු 22 දා පැවති මාධ්‍ය සාකච්ඡාවක දී පවසා ඇත්තේ යුරෝපය හා ඇමරිකාව ඇතුළු රටවල්වල සිදුවන සමහර ක්‍රියා නිසා ග්ලැසියර් දිය වෙනවාද නැතහොත් වෙනත් හේතූන් ඒ සඳහා බලපාන්නේ ද යන්න සොයාබැලීමත්, ලෝකයේ වනාන්තර හා අනෙකුත් පරිසර පද්ධතීන් පිළිබඳ ගවේශනයත් තම ව්‍යාපෘතියේ අරමුණ බවයි.

නමුත් ලෝක ගෝලයේ ධ්‍රැවවල පිහිටා ඇති අයිස් දියවීම, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා සිදුවන බවත් ප්‍රධාන වශයෙන්ම ඊට ඇමරිකාව ප්‍රමුඛ යුරෝපා රටවල බහුලව සිදුවන පරිසර දූෂණය බලපාන බවත් අප අසා ඇත්තෙමු.

එහෙත් මේ පිළිබඳව ගුණාත්මක පර්යේෂණයක් සිදුකිරීමට යැයි පවසමින් NASA ආයතනය මඟින් ICESat - 2 (Ice, Cloud and LAND Elevation Sattelite - 2) සම් චන්ද්‍රිකාවක් මෙම මස අභ්‍යවකාශගත කිරීමට සැලසුම් කර තිබේ. ලේසර් කිරණ ආධාර කරගෙන පරීක්ෂණ කටයුතු සිදුකරන මෙම චන්ද්‍රිකාව කුඩා මෝටර් රථයක් තරම් වන අතර ඊට ඇමරිකානු ඩොලර් මිලියන එකකට මදක් වැඩි පිරිවැයක් දරා ඇත. එමගින් අයිස් තට්ටුවල වසර තුනක් පුරා සිදුවන වෙනස්වීම්, අයිස් තට්ටුවල ඝනකම අඩුවීම, වැඩිවීම හා සිදුරුවල ප්‍රමාණය ආදිය අඟලෙන් පහෙන් එකක් පමණ වන කුඩා කොටස් දක්වා නිරීක්ෂණය කිරීමේ හැකියාව මෙහි විශේෂත්වයයි.

Sports

# ආසියාවටම තර්ජනයක් වූ "තර්ජිනී"




තර්ජිනී ශිවලිංගම් උපත ලැබුයේ දශක තුනක් තිස්සේ දිව ගිය ශාපලත් යුධ ගිනිදැල් මැද යාපනයේ, පුන්නලායිකට්ටුවාන් ප්‍රදේශයේදී ය. ඇය නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා උපාධිධාරිනියකි. 2003 වසරේදී යාපනය, දැල්පන්දු කණ්ඩායමක් නියෝජනය කරමින් මඩකලපුවේ පැවති තරඟයකට පැමිණි ගමන තර්ජිනීගේ ක්‍රීඩා දිවිය මෙතරම් දුර රැගෙන යාවි යැයි ඇයවත් නොසිතන්නට ඇත. කොටින්ම ඒ වන විට පාවහන් යුගලක් පැළඳ ක්‍රීඩා කිරීමද තර්ජිනීට නුහුරු අත්දැකීමක් විය.

පසුව 2005 වසරේ සිට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඇය ක්‍රීඩා කළේ ගෝල විදින්නියක (ගෝල් ෂූටර්) වශයෙනි. සෙන්ටිමීටර 208ක් උසැති ඇය සිය උසත්, ක්‍රීඩා හැකියාවත් මනාව ප්‍රයෝජනයට ගනිමින් ගත වූ කාලයේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් විශිෂ්ට දස්කම් දැක්වීමට සමත් වූවාය. 2009 වසරේ ආසියානු දැල්පන්දු ශූරතාවය හිමි කරගත් ශ්‍රී ලංකා කණ්ඩායම පවා නියෝජනය කළ ඇයගේ දක්ෂතාවය කොතරම්ද යත් 2005, 2009, සහ 2012 වසරවල දී ආසියාවේ දක්ෂතම විදින්නිය (බෙස්ට් ෂූටර්) ලෙසත් තේරුණාය. 2011 දී ද ලෝක දැල්පන්දු ශූරතාවලියේ දක්ෂතම විදින්නිය වූයේත් තර්ජිනීමය. එමෙන්ම ඇය ශ්‍රී ලංකා ජාතික පිලේ නායකත්වයට පවා පත් වූවාය. ඇයගේ නායකත්වය යටතේ 2012 වසරේදී ආසියානු දැල්පන්දු ශූරතා තරඟාවලියේ අවසන් තරඟයේදී ශ්‍රී ලංකාව සිංගප්පූරු කණ්ඩායමට පරාජය වූයේ එක් ලකුණකිනි.

එහෙත් සුපුරුදු ලෙසම ඇයද විවිධ කෙනෙහිලිකම්වලට ලක්වන්නේ රටේ අවාසනාවටය. දැල්පන්දු ක්‍රීඩා පරිපාලනය සමඟ හටගත් මතභේදයක් හේතුවෙන් තර්ජිනී ශිවලිංගම් ද 2014 වසරේදී කණ්ඩායමෙන් ඉවත් වී සිටි අතර මෑතකදී ඇය නැවතත් කණ්ඩායමට එක් වූවාය.

ඉදින් ඇය ආ මගෙහි මල් පෙති විසිර නොතිබිණි. නුහුරු-නුපුරුදු ගෙන්දගම් පොළොවේ ලත් ඒ සියලු අත්දැකීම් තර්ජිනී එක මිටකට ගොනු කර ගත්තාය. අදට ද එහි වෙනසක් නැත. අදටත් ඇය ගෙවන්නේ නේවාසික ජීවිතයකි. ශ්‍රී ලංකා නාමය වෙනුවෙන් සියල්ල විඳදරා ගැනීමට ඇය සූදානම්ය.

"මගේ මව්බිම තරම් මම ආදරය කරන තවත් තැනක් වෙන කොහේවත් නැහැ. අද මම මෙවැනි තත්වයක සිටින්නේ ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කිරීමට තරම් වාසනාවන්ත වූ නිසා තමයි." ඇය අධිෂ්ඨානයෙන් පවසන්නීය.




## බර ඉසිලීමේ සහ සවි ඉසලීමේ පදක්කම් ශ්‍රී ලංකාවට



ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පැවති අන්තර්ජාතික ශිෂ්‍ය ඔලිම්පික් බර ඉසිලීමේ සහ සවි ඉසිලීමේ තරඟාවලියේ දී පදක්කම් රැසක් දිනා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. මෙහි දී බර ඉසිලීමේ සහ සවි ඉසිලීමේ තරඟ අංශවලදී රන්පදක්කමක් හා ලෝකඩ පදක්කම දිනාගැනීමට විසල් හර්ෂද සිල්වා ක්‍රීඩකයා සමත්විය. ඔහු කොළඹ කොටහේන මධ්‍ය මහා විද්‍යාලය නියෝජනය කරමින් සහාගී වූ අතර එම පාසලේ එම්.සී. සංකල්ප හා තුවාන් ඉජාස් යන ක්‍රීඩකයන්ද පදක්කම් ලබාගත්හ. මෙම ක්‍රීඩකයින්ගේ පුහුණුකරු ලෙස කටයුතු කළේ රුවන් පතිරණ මහතායි.

## පිටියෙන් මෙපිට සහෝදරත්වය




ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගී වූ මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමේ හා ඔවුන්ගේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද උත්සවයක් පසුගිය සැප්තැම්බර් මස 07 වනදා ටොරින්ටන් ක්‍රීඩා පිටියේදී පැවැත්විණි.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අගයක් ලබා දෙමින් සෙසු ක්‍රීඩකයින්ට ද උත්තේජනයක් ලබා දීම මෙහි අරමුණ විය. කෙසේ වුවද මෙම ඇගයීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් විසින් සිදුකළේ ක්‍රීඩාවට සැබැවින්ම ආදරය කරන්නන් රැසකගේ ද සහයෝගය ඇතිවයි.

එසේම තම සහෝදර ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙලෙස රතු පලස් මතින් ගෙන්වා, සමරු සිහිවටන හා මූල්‍ය පරිත්‍යාගයන් පුද කළේ ඔවුන් සමඟ උරෙනුර ගැටුණු සෙසු ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙන්ම ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයින් වීම ද විශේෂත්වයක් විය.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් වෙන්කරන සුළු මුදලත් ගසාකන, ඔවුන්ට කෙනෙහිලිකම් කරමින් දක්ෂතා මොට කිරීමට උත්සාහ දරන ක්‍රීඩා බලධාරීන් බහුතරයක් ඉන්නා රටක ක්‍රීඩක ක්‍රීඩිකාවන් සතු සැබෑ දක්ෂතා ඇගයීමට හා දිරිගැන්වීමට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වූ මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් හා මෙරට මලල ක්‍රීඩාවට ආදරය කරන සියලු දෙනාටම Forward අපගේ හදපිරි උත්තමාචාරය..!!

## ශූරයන්ට නොමැති පුහුණුකරුවන්..




පසුගිය වසරේදී ඉන්දියාවේ ඔඩිෂාහිදී පැවැති ආසියානු ශූරතා තරඟාවලියේ දී මීටර් 800 ධාවන ඉසව්වෙන් රන් පදක්කම දිනාගත් නිමාලි ලියනාරච්චිට පසුගිය දා පැවති ආසියානු ක්‍රීඩා උළලේ මීටර් 800 මූලික ධාවන ඉසව්වෙන්ම ඉවත් වීමට සිදුවිය.

ඇය එම තරඟයෙන් පසුව අදහස් දක්වමින් කියා සිටියේ තමන් සහභාගී වූ තරඟය මූලික වටයේ තරඟ අතරින් අපහසුම තරඟය වූවත් තමන්ට උපදෙස් ලබා ගැනීම සඳහා පුහුණුකරු හෝ නොසිටි බවයි.

සැබවින්ම පසුගිය වසරේ ආසියානු ශූරතාවලියේදී මෙන්ම ආසියානු ගෘහස්ථ තරඟාවලියේදී ද පදක්කම් ලැබූ නිමාලි ලියනාරච්චි, රුමේෂිකා රත්නායක හා ඉඳුනිල් හේරත්ට තම පුහුණුකරුවන් සමඟින් මෙම තරඟාවලියට සහභාගී වීමට වරම් හිමි නොවීම කණගාටුදායකයි. කෙසේ වෙතත් මෙම තරඟාවලියට නිලධාරීන් 78 දෙනෙක් නම් සහභාගී වනු දැකගත හැකි විය.

ඇත්තෙන්ම පුහුණුකරුවෙකු සිටීම, තරඟයකට කෙතරම් වාසිදායක දැයි යන්න ඕනෑම ක්‍රීඩකයෙකුගෙන් හෝ ක්‍රීඩිකාවකගෙන් අසා දැනගත හැකිය.

එම නිසා දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ ඔවුන්ගේ පුහුණුකරුවන් යවනවා වෙනුවට ක්‍රීඩා ලොක්කන් විසින් රට සවාරි ගැසීමට කටයුතු කිරීම අපේ රටේ ක්‍රීඩාවට එරෙහි මරු පහරක් බව නම් ලියා තැබිය යුතුමය.

## තනි රටකට කොළ එළි දල්වන උතුරු හා දකුණු කොරියානුවන්



2032 වසරේ පැවැත්වෙන ඔලිම්පික් උළලේ සත්කාරකත්වය සඳහා උතුරු කොරියාව සහ දකුණු කොරියාව ඒකාබද්ධව තරඟ කිරීමට තීරණ කර තිබෙනවා. උතුරු කොරියානු ජනාධිපති කිම් ජොන්ග් උන් සහ දකුණු කොරියානු ජනාධිපති මූන් ජේ ඉන් අතර මේ පිළිබඳ හමුවක් පසුගියදා සිදු වුණා.

එහිදී 2032 ඔලිම්පික් උළලේ සත්කාරකත්වය සඳහා සම තරඟකරුවන් ලෙස ලංසු තැබීමට ඔවුන් දෙදෙනාම එකඟ වූ බව විදෙස් වාර්තා සඳහන් කරයි.

මේ අතර එම වාර්තා මඟින් වැඩිදුරටත් පවසන්නේ එළැඹෙන 2020 ටෝකියෝ ඔලිම්පික් උළලේදී උතුරු කොරියාව සහ දකුණු කොරියාව එක්ව තරඟ කරන බවයි.

දකුණු කොරියාවේ පියොංචැන්ග්හි දී පැවැති ශීත සෘතු ඔලිම්පික් උළෙලට උතුරු කොරියාවද සහභාගී වූ අතර එහි දී දෙරටම ඒකාබද්ධ කණ්ඩායම් ලෙස සමහර ප්‍රධාන පෙළේ තරඟාවලිවලට එක් වීම ද ලෝකයට නවමු බලාපොරොත්තු දීමට සමත් විය.

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය
*FORWARD කවිපිටුව,*
*අංක 464/20, පන්නිපිටිය පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල.*

## කාලේන ධම්ම සවණං

ඉස්සර
සාධුකාරය
දැං
සිනා හඬ
හූ හඬ
විසිල් හඬ

] **සමන්ත හේරත් - අනුරාධපුරය**[



## ජීවිතය

එයා හෙව්වේ ජීවිතය
මං හෙව්වේ ආදරය
එයාට ඕනා වුනේ
හිරවුණු රාමුවක් ඇතුළේ
ජීවිතය විඳින්න
මට ඕනෑ වුනේ
ඉගිල්ලෙමින් පාවෙමින්
සැහැල්ලුවෙන්
ආදරය විඳින්න
අපි ගියේම මාවත් දෙකක
අපි වෙන් වුණා එක්තරා දවසක

එයා පවුල් වුණා
විඳවනවා ජීවිතය
ලුණු රහට.....
මං ආදරෙන් අවුල් වුණා
විඳවනවා ජීවිතයේ
තිත්ත රස......

එදා අපි දෙතැනක
ඒත් අද අපි එකම තැන
යනවා දැන් එකම මඟ
දෑත් පටලවගෙන
මුමුණමින් ජීවිතය
කොඳුරමින් ආදරය

ආදරය තියෙන්නෙම
ජීවිතය ඇතුළතම
පපු කුටීරයක් තුළ
හරිම හරි පරිස්සමට

] **චලනි පෙරේරා** - FB **ඇසුරෙන්** [

## මහ උපාසිකාවෝ

වෙසක් පෝ දිනයක
සිතුණි යාමට පන්සල්
පොරකාගෙන මුල්ලක
එළා ගතිමි
රෙදි කඩමාල්ල

රවා බැලුවෝය
නිත්‍ය සාමාජික
උපාසකම්මලා රොත්තම
කොලීජියේ නවක වදය
සිහි වූවා සැණෙකින් මට

පැන් නොමුසු කිරි බතට
දිගු කළෙමි ගෙනා සහල් මිට
උදුරලා ගත්තේ මහ උපාසිකාව
සාධු.... සාධු.... සාධු....

සුවඳයි ඉදෙයි කිරිබත
හදන්නට නොමැති ඉඩ
බෙදන්නටවත් ලැබෙයිද
බුදු පාත්තරයට
බලා සිටියෝය සෙසු පිරිවර

මහ උපාසිකාවෝම
පිසූ කිරිබත පුදා
දොහොත් මුදුන් තබා
සියල්ලන්ටම වඩා හඬ ගා
සාධු.... සාධු.... සාධු....

තිබහක් ආ බැවින්
පියනැගුවෙමි
සොයා පැන් පොදක්
වික්ෂිප්ත වූවෙමි
අහෝ...
පොරකා දුන්, උදුරා ගත්
සහල් මිටි මිටි
තැන් තැන්වල ගොඩගැසී
මුමුණයි....
රජ්ජුමාලා, විශාකා වෙනසක්
සාධු.... සාධු.... සාධු....

] **පුබුදු විජේසිංහ - අනුරාධපුරය** [



## සදාකාලික තරුණයා නුඹ

වැළලුවද
බොලීවියන්
පසු කඳු යට
හැකිද කළ
අමතක
සදාකාලික
තරුණයා නුඹ
කිසිදා
නොමියෙන

] **අයේෂ් ශෂිමාල් - හම්බන්තොට** [

## සඳ නැති රැයක, රොබරෝසියා මලට මැයි මල කී කව



නුඹෙන් උදුර ගත් දින
ප්‍රේම කථාතර දොඩමළු වූ හිත
ඉල් මහේ සඳ
මියැදුණු රැයක..
නුඹ නුඹෙන් ඇසුවාද,
කෑ ගසා හැඬුවාද....?

"මට දියන් නොමිනිසුනේ
තෙපි උදුර ගත් සඳ....."

] **දිනූෂ පරණවිතාන - හම්බන්තොට** [



# නිර්මාණ කළ යුත්තේ සමාජ ප්‍රගමනය වෙනුවෙනි

## ධනංජය බණ්ඩාර

### ඔබ නියෝජනය කරන්නේ කුමන කලා ක්ෂේත්‍රයක්ද?

ප්‍රධාන වශයෙන් නම් මම සිනමාකරුවෙක්. එයිනුත් කෙටි චිත්‍රපට තමයි මගේ ක්ෂේත්‍රය. එයට අමතරව කෙටි කතා, කවි රචනය මම පාසල් යන කාලයේ පටන්ම කරගෙන යනවා. මීට අමතරව මම නර්තන ශිල්පියෙක් සහ බෙරවාදකයෙක් ලෙසත් කටයුතු කරනවා.

### ඉතාමත් කෙටි කාලයක් උපයෝගී කරගෙන නිර්මාණය කරන කෙටි චිත්‍රපට තුළින් සමාජ මතයක් නිර්මාණය කළ හැකිද?

පුළුවන්. මම නිර්මාණයක් කරන්නේ ලෝකය දිහා බලලා, සමාජ ප්‍රගමනය සඳහා අවශ්‍ය ආකාරයටයි. ඒකෙදි චිත්‍රපටය කෙටිද දිගුද කියන එක නෙමෙයි වැදගත්, එය සමාජ සංවර්ධනයේ ප්‍රගමනයට දායක වන ප්‍රමාණය තමයි වැදගත්. නව කතා, කෙටි කතා, කවි ආදියෙන් වගේම කෙටි චිත්‍රපටි තුළිනුත් සමාජ මතයක් නිර්මාණය කළ හැකියි.

### එහෙම නම් ඔබට දැනුණු විශිෂ්ට කෙටි සිනමාපට කීපයක් ගැනත් කිව්වොත්......

අබ්බාස් කයියෝසෝඩිල්ගේ "ද බ්රෙඩ් ඇන්ඩ් ඇලී", බාබක් අන්වාරිගේ "2+2=5", ජේම්ස් ගර්නිම්ස්ගේ "Room-08" , ඩෙනිස් වීලන්ගේ "නෙක්ස්ට් ෆ්ලෝ" කියලා කියන්නේ මට ගොඩක්ම හිතට වැදුණු නිර්මාණ කිහිපයක්.

### කෙටි චිත්‍රපටි ඇගයීමට ලක් කරන සම්මාන උළෙල ගැනත් කිව්වොත්.....

ලෝකයේ කෙටි චිත්‍රපට සඳහාම වෙන්වූ සම්මාන උළෙල තිබෙන අතරම සමහර දිගු චිත්‍රපට සඳහා තිබෙන සම්මාන උළෙලවලදි පවා කෙටි චිත්‍රපට සඳහාත් සම්මාන ලබා දෙනවා.

### ඔබ මෙතෙක් පැමිණි කලා ගමන් මඟ තුළ ලැබූ ජයග්‍රහණ එහෙමත් ඇතිනේ. ඒ මොනවාද?

මුලින්ම මගේ දෙවන කෙටි චිත්‍රපටය වන "Coffe" චිත්‍රපටයට ජූරි සම්මානයකුත්, ඊට පසු කරපු "40th poem" කෙටි චිත්‍රපටයට තවත් සම්මානයකුත් හිමිවුණා. ඒ වගේම මගේ "song of the Innocent" කෙටි චිත්‍රපටයට දෙරණ සිනමා උළලේදී, යාපනය සිනමා උළලේදී, තරුණ සිනමා උළෙලේදී වගේම I the Digicon 06 සිනමා උළලෙදීත් හොඳම කෙටි චිත්‍රපටයට හිමි සම්මානය ඇතුළු සම්මාන ලැබුණා. ඊටත් අමතරව එම කෙටි චිත්‍රපටය ඉන්දියාවේ දිල්ලි සිනමා උළලේ හා Shee සිනමා උළලේ සම්මාන සඳහා නිර්දේශ වෙලා තියෙනවා.

> "තාමත් අපට සිනමාව පිළිබඳ හදාරන්න පාසලක් නෑ."

### හොඳයි.... කෙටි චිත්‍රපට ලාංකීය ජන සමාජය තුළට ගමන් කරලා තිබෙන ප්‍රමාණය ගැන ඔබ තෘප්තිමත් ද?

නැහැ, කොහොමත්ම නෑ. මොකද මේ ගැන රජයේ මැදිහත් වීමක් නම් නොමැති තරම්. දිගු චිත්‍රපට, කෙටිකතා, නවකතාවලට තිබෙන විචාරයන් සහ අනුග්‍රහයන් මෙම කෙටි චිත්‍රපට සඳහා දක්නට ලැබෙන්නේ නැහැ.

### ලංකාව තුළ කෙටි චිත්‍රපට නිර්මාණය කිරීමේදී මුහුණ පාන විශේෂ ගැටලු මොනවාද?

ඇත්තටම කෙටි චිත්‍රපටකරුවන් මුහුණ දෙන ප්‍රධානම ගැටලුව තමයි මුදල් ප්‍රශ්නය. නිර්මාණකරුවාටම මුදල් යෙදවීමට සිදුවීම. දියුණු තාක්ෂණයේ හිඟකමත් විශාල ගැටලුවක් බොහෝදුරට කෙටි චිත්‍රපටකරුවන් තමන්ගේ නිර්මාණයන් කරන්නේ ජංගම දුරකතනයෙන්.



ඔවුන්ට රජයේ හෝ සංස්කෘතික අමාත්‍යංශයේ හෝ සහයෝගයක් නොමැති තරම්. ඒ වගේම තමයි කෙටි චිත්‍රපට සඳහා තවමත් ප්‍රදර්ශනාගාරයක් නොමැති වීමත් ගැටලුවක්. 70/80 දශකවල දී නම් මේ සිනමාහල්වල දිගු චිත්‍රපට ආරම්භ වීමට පෙර කෙටි චිත්‍රපට පෙන්නුවා. අනෙක් අතට තාමත් අපට සිනමාව පිළිබඳ හදාරන්න පාසලක් නොමැතිකම පවා කවුරුත් මුහුණ දෙන විශාල අභියෝගයක්.



### තරුණ නිර්මාණකරුවෙක් ලෙස ඔබ අපේ රටේ තාරුණ්‍යයට දෙන පණිවිඩය මොකක්ද?

ඕනෑම කෙනෙකුට තමන්ට අවස්ථාවක් එන වෙලාවක් තිබෙනවා. අන්න ඒ අවස්ථාව මඟහරින්නේ නැතුව නිවැරදි දෙයකට යොදාගන්න කියලා තමයි කියන්නේ.

# ඇතැන්ස්හි ලෙළ දුන් කොමියුනිස්ට් තරුණ අභිමානය



ග්‍රීක කොමියුනිස්ට් තරුණ සංවිධානය විසින් පවත්වන ලද 44 වන ග්‍රීක කොමියුනිස්ට් තරුණ උළෙල පසුගිය සැප්තැම්බර් 20, 21 හා 22 යන දිනයන්හි ග්‍රීසියේ ඇතැන්ස් නුවර දී පැවැත්විය. ග්‍රීක කොමියුනිස්ට් තරුණ සංවිධානය ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සංවිධානය වන අතර මෙවර උළෙලේ විශේෂත්වය වන්නේ එය ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ සිය වැනි සංවත්සරයට සහ ග්‍රීක කොමියුනිස්ට් තරුණ සංවිධානයේ පනස් වැනි සංවත්සරයට සමගාමීව පැවැත්වීමයි.

මෙම උළෙල ග්‍රීක කොමියුනිස්ට් තරුණ සංවිධානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අතර මෙවර එය නැරඹීම සඳහා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සහභාගී විය. පංති අරගලය, නිර්ධන පංති දේශපාලනය, සමාජවාදය, කොමියුනිස්ට්වාදය පිළිබඳව මෙන්ම ධනපති ක්‍රමය හා අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය ආදී තේමා ඔස්සේ පැවැත්වූ ප්‍රදර්ශන, සංස්කෘතික ප්‍රසංග හා දේශන ආදියෙන් උළෙල සමාලංකෘත විය. ඒ සඳහා ජාත්‍යන්තර සමාජවාදී හා කොමියුනිස්ට් පක්ෂ බොහෝ ප්‍රමාණයකටද ආරාධනා ලැබී තිබූ අතර ලොව පුරා සංවිධාන හතළිහක පමණ නියෝජිතයින් එයට සහභාගී විය. එම සංවිධානවලටද ප්‍රදර්ශන කුටි වෙන්ව තිබූ අතර එමඟින් උළෙල තවත් වර්ණවත් විය. මේ අතර සමාජවාදී ශිෂ්‍ය සංගමයේ හා සමාජවාදී තරුණ සංගමයේ නියෝජනයක් ද විය.

උළෙලට සමගාමීව මෙම වර්ෂයේ තවත් විශේෂත්වයක් ලෙස මාක්ස් ගේ උපතින් වසර දෙසීය සමරමින් ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් දේශනයක් ද පැවැත්විය. ඊට සහභාගී වූ සෑම රටකම පාහේ නියෝජිතයින් විසින් වත්මන් ධනේශ්වර සූරාකෑම හමුවේ මාක්ස්වාදයේ ඇති වැදගත්කම හා කාලීන බව පිළිබඳව අදහස් දක්වන ලදී.

තවද උළෙලට සමගාමීව පලස්තීනයට සහයෝගය පළකරමින් ද, කියුබාවට සහයෝගය පළකරමින් හා අධිරාජ්‍යවාදී සම්බාධකවලට එරෙහිව විරෝධය පළකරමින් ද, අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව ද වැඩසටහන් පවත්වන ලදී. උළෙල අතරතුර බොහෝ රටවල නියෝජිතයින් විසින් අනෙකුත් රටවල නියෝජිතයින් සමග සාකච්ඡා හා ද්වීපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම ද සිදුකරන ලද අතර එමඟින් සංවිධාන අතර සබඳතා ශක්තිමත් කරගැනීමටද අවස්ථාව උදාවිය.

මෙවර උළෙලේ ප්‍රධාන තේමා පාඨය වූයේ 'මෙතරම් කාලයක් එය දීර්ඝ මාර්ගයක් ද, දුෂ්කර මාර්ගයක් ද, නිශ්චිත මාර්ගයක් ද වූ අතර දැන් එම මාර්ගය ඔස්සේ ගමන් කිරීම ඔබට භාරය' යන්නය. උළෙලේ සමාප්තිය සනිටුහන් කරමින් පැවති ප්‍රධාන රැලියට හා දේශනයට පනස් දහසකට අධික පිරිසක් සහභාගී වූහ. එහිදී ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් දිමිත්‍රිස් කොට්සොම්පස් සහෝදරයා විසින් දේශනයක් සිදුකළ අතර ධනේශ්වර ක්‍රමය විසින් වර්තමානයේ ලොවට අත්පත් කර දී ඇති විනාශකාරී තත්ත්වයන් පිළිබඳව දීර්ඝ වශයෙන් පැහැදිලි කළේය. මේ අතර අධිරාජ්‍යවාදය හා ධනේශ්වර ක්‍රමය පෙරළා, කොමියුනිස්ට්වාදය ගොඩනැගීමේ කාර්යයේ ඇති වැදගත්කමද ඔහු අවධාරණය කරන ලදී. මෙම ප්‍රධාන රැලියට ඊශ්‍රායල හමුදාවන්ට එරෙහිව නැගී සිටි පලස්තීන ක්‍රියාකාරිනියක් වන 17 වියැති අහෙද් තමීමී සහභාගී වී සිටීමද විශේෂත්වයක් විය.

වසරක් පාසා කොමියුනිස්ට්වාදීන්ගේ හඬ ලොවට පතළ කරන ග්‍රීක කොමියුනිස්ට් තරුණ උළෙල මෙවර සමාප්ත වූයේ ඉතිහාසයේ වැඩිම පිරිසක් සහභාගී වූ සාර්ථකම ග්‍රීක කොමියුනිස්ට් තරුණ උළෙල වශයෙනි.



## සිම්බාබ්වේ රජයේ වියදම් අඩු කරයි



සිම්බාබ්වේ රාජ්‍යය ලෝක බැංකුවෙන් සහ අප්‍රිකානු සංවර්ධන බැංකුවෙන් ලබා ගෙන ඇති ණය සඳහා වන හිඟ මුදල් ගෙවා නිම කිරීමේ අරමුණින් එරට රජයේ වියදම් අඩු කිරීමේ වසර 03ක වැඩපිළිවෙළක් සකසා ඇත.

එරට මුදල් අමාත්‍යවරයා පවසන්නේ ඩොලර් බිලියන 1.8 ක ණය හිඟයක් ගෙවීමට ඇති බවත් එය ගෙවා නිම කිරීම රටෙහි ආර්ථික සුරක්ෂිතතාවයට වැදගත් බවත්ය.

## ප්‍රංශයේ අයවැය පරතරය ඉහළට



ප්‍රංශයේ අයවැය පරතරය වැඩිවීමත් සමඟ එරට ආර්ථිකය ස්ථාවර කරගැනීමේ අරමුණින් ආර්ථික ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදුකිරීමට ප්‍රංශ ජනපතිවරයා තීරණය කර ඇත. ඒ අනුව සමාජ සුභසාධන වියදම් අඩු කිරීම මූලික වී ඇත. ප්‍රංශයේ ජනාධිපති මැක්රොන් සිය ධූර කාලය තුළ ගෙන ආ තවත් මෙවැනි ප්‍රතිසංස්කරණ නිසා දැඩි අප්‍රසාදයට පත්ව සිටින බව එරට මාධ්‍ය වාර්තා කරයි.

## තෙරේසාගේ සැලසුමට විරෝධතා රැසක්



බ්‍රිතාන්‍යය, යුරෝපා සංගමයෙන් ඉවත් වීමට අදාළව එරට අගමැතිනි තෙරේසා මේ විසින් ඉදිරිපත් කර ඇති සැලසුමට ඇගේ පක්ෂයේ සාමාජිකයින් 80 ක් විරුද්ධ වී ඇති අතර මේ සමඟම එම කන්සර්වේටිව් පක්ෂය තුළ දරුණු බෙදීමක් හටගන්නා බව මාධ්‍ය වාර්තා කරයි. ඉදිරියේ දී පැවැත්වෙන පක්ෂ නායකත්ව සමුළුවේදී ඇයට මේ සම්බන්ධව ගැටලු රැසකට මුහුණ දීමට සිදුවන බවද එම පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් තවදුරටත් කරුණු දක්වමින් පවසා ඇත.

## කසළ කලාවක් කළ කෙන්යානුවා



ඉවතලන කසළවලින් කලාත්මක නිර්මාණ කිරීමට කෙන්යාවේ 29 හැවිරිදි එවන්ස් ඇන්ගුරෙයි නම් තරුණයාට හැකිව තිබේ. ඔහු එරට පාරවල්වල දමා ඇති ප්ලාස්ටික්, ලී වැනි බොහෝ දේ එකතු කරමින් කලාකෘති නිර්මාණය කර ඒවායින් ප්‍රදර්ශනයක්ද පවත්වා ඇත. මෙමඟින් ආර්ථික වාසියක් මෙන්ම හැකිතාක් දුරට පරිසරයද රැක ගත හැකි බව එවන්ස් පවසා ඇත.

## ලොව පුරා කුසගින්න දරුණු වේ



ලොව පුරා කුසගින්නෙන් පෙළෙන පුද්ගලයින්ගේ කැපී පෙනෙන වර්ධනයක් සිදුව ඇති බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසා ඇත. 2017 වසරේ කුසගින්නෙන් පෙළෙන පුද්ගලයින්ගේ සංඛ්‍යාව මිලියන 821 ක්ව පැවති අතර ඊට පෙර වසරේ මිලියන 804ක්ව පැවතිණි. මෙය කැපීපෙනෙන වර්ධනයක් බවත් මේ සඳහා දේශගුණික විපර්යාස හා යුද්ධ ප්‍රධානතම හේතුව බවත් එම සංවිධානය පවසා තිබේ.

දැනුම

පසුගිය forward කලාපයෙන් අප සාකච්ඡා කළේ සෞරග්‍රහ මණ්ඩලයේ ඇති ග්‍රහක පටිය පිළිබඳවය. මෙවර අප සාකච්ඡා කරනුයේ පෘථිවිය බිහිවීම පිළිබඳවයි.

## විශ්වයේ බිහිවීම - 11කොටස

# පෘථිවිය බිහිවීම



පෘථිවිය යනු අප දන්නා තරමින් විශ්වය තුළ ජීවීන් වාසය කරනා එකම නිවහනයි. මේ ග්‍රහලෝකය මේ තරම්ම සුවිශේෂී වීමට හේතුව කුමක්දැයි පිළිතුරු සෙවීමට නම් අපට කාලය හරහා අතීතයට යන්න වෙනවා.

පෘථිවියේ මුල්ම ආරම්භය සිදුවන්නේ මීට වසර බිලියන 05කට පමණ පෙරයි. ඒ වන විට පෘථිවිය පිළිබඳව කිසිඳු ලක්ෂණයක් හෝ මතුව තිබුණේ නැහැ. ඒ වගේම අපේ සෞරග්‍රහ මණ්ඩලයේ පැවතියේ හිරු සහ අලුත බිහිවූ තාරකාවලින් වට වූ දූවිලි වලාවක් විතරයි. පෘථිවිය එතකොටත් බිහිවෙලා නැහැ. නමුත් මුලින්ම ගුරුත්වාකර්ෂණය විසින් එම දූවිලි වලාවේ දූවිලි, කුඩා ගල් කැට බවට පත් කරමින් එකිනෙක වෙත ඇද ගන්නවා. අද පවතින මෙම ඉතාමත් සංකීර්ණ ග්‍රහලෝකය නිර්මාණය වන්නේ එලෙස වසර මිලියන ගණනාවක් තිස්සේ ගුරුත්වය මඟින් මෙම දූවිලි සහ ගල් කැබලි එකිනෙකට ඇද ගැනීමෙනුයි.

ඒ වන විට පෘථිවිය වගේම තවත් ග්‍රහලෝක 100 ක් පමණ සූර්යයා වටා කරකැවෙමින් පැවති නමුත් වසර බිලියන 4.5කට පෙර පෘථිවිය අද පේන ආකාරයට වඩා අතිශය කුරිරුයි. එහි පෘෂ්ඨයේ මතුපිට ඉතා ඉහළ උෂ්ණත්වයක් පැවතියා. ඒ ෆැරන්හයිට් අංශක 2000කටත් වැඩි අගයකි. එයට කිසිඳු වායුගෝලයක් තිබුණේ නැහැ. එහි පැවතියේ කාබන්ඩයොක්සයිඩ්, නයිට්‍රජන් හා ජල වාෂ්ප පමණයි. ඒ ද ඉතා උණුසුම්ව සහ විෂ සහිතවයි.

ඒ වන විට අප එයට ළං වූවානම් ක්ෂණයෙන් දැවී අළු වී යාමට හෝ තප්පර කිහිපයකින් භුස්ම හිරවී මිය යාමට හෝ ඉඩ තිබුණා. මේ අයුරින් බිහිවුණු මුල්ම පෘථිවිය කකාරන ද්‍රව පාෂාණ ගුලියක් වැනි අනන්ත ලාවා සාගරයකින් යුක්ත වුණා.

මේ කාලයේදීම අපේ පෘථිවිය වැනිම අලුත නිර්මාණය වූ "තියා" නම් නාඹර ග්‍රහලෝකය කෙළින්ම පෘථිවි කක්ෂය දෙසට පැමිණෙමින් තිබුණා. වර්තමානයේ අඟහරු ග්‍රහයාගේ ප්‍රමාණයෙන් යුක්ත එම ග්‍රහලෝකය තප්පරයට සැතපුම් 10ක පමණ වේගයෙන් ගමන් කරමින් තිබුණු අතර එය පෘථිවි කක්ෂයට ළංවත්ම විසි ගුණයකින් පමණ වේගය වැඩි වුණා. උණ්ඩයකට වඩා වේගයෙන් ආපු තියා ග්‍රහලොව පෘථිවියේ වේගයෙන් හැපුණා. එයත් සමඟ ඇතිවූ පිපුරුම් තරංග පෘථිවිය පුරාම දිවගියා. නාඹර ග්‍රහලෝක දෙකම ද්‍රවාකාරයට පත්වුණා. එයින් පසුව ටොන් ට්‍රිලියන ගණනාවක සුන්බුන් අවකාශයට මුදා හැරියා.

නමුත් ගුරුත්වය හේතුවෙන් කුඩා ගල්, රක්ත දූවිලි වලාවන් සහ පාෂාණ වලාවක් බවට පත්වෙමින් වසර දහස් ගණනක ගමන් මග ඔස්සේම නැවතත් පෘථිවිය වටා ගමන් කළා.

මෙම වළල්ල මඟිනුත් පෙර පරිදිම සැතපුම් දෙදහසක පමණ ගෝලයක් ඇති වුණා. එමඟින් තමයි අපේ චන්ද්‍රයාගේ උපත සිදුවුනේ. එය පෘථිවියට ආසන්නවම, සැතපුම් 14000 ක් ඈතින් තමයි මුලින්ම පැවතියේ. (දැන් එහි දුර සැතපුම් මිලියන කාලක් පමණ වේ.)

කාලයත් සමඟ පෘථිවිය ක්‍රමානුකූලව සිසිල් වෙන්න පටන් ගන්නවා. මුලින්ම පෘථිවියට ඉර උදාව සිදුවුණේ පැය දෙකතුනක පමණ කාලයකට පමණයි. පෘථිවිය ඒ වන විට ඉතා වේගයෙන් කරකැවෙමිනුයි පැවතියේ. සම්පූර්ණ දවසකටම පැවතියේ පැය 06 ක කාලයක් පමණයි. දවස් ඉතා වේගයෙන් ගෙවුණත් පෘථිවිය වෙනස් වුණේ ඉතා සෙමින්.

සෞරග්‍රහ මණ්ඩලය බිහිවීමෙන් පසු ඉතිරි වූ ග්‍රහක කැබලිවලින් ඇතිවූ විශාල උල්කාපාත වර්ෂාවක් විසින් අපේ පෘථිවියට පහර දීමක් සිදුවුණා. ඒ අදින් වසර මිලියන 3900කට පමණ පෙරදීයි. මේ උල්කාපාත ඇතුළත පළිඟුමය ආකාරයක් පැවති අතර එය හරියට ලුණු වෛරමක ස්වභාවයක් ගත්තා. ඒ වගේම එම උල්කාපාත තුළ ඉතා සියුම් ජල බිඳිතිත් තිබුණු අතරම පෘථිවිය තුළ ජීවය බිහිවීමට අදාළ සංඝටක හා මූලද්‍රව්‍ය පවා අඩංගුව පැවතියා.

එම උල්කාපාත බෝම්බ ගසනවා වැනි ආකාරයට පෘථිවියට පහරදෙනු ලැබුවා. මෙම පහරදීම් අඛණ්ඩව වසර මිලියන 20 ක් පුරාවට පැවති අතර මෙම උල්කාපාත තුළ තිබූ සියුම් ජල අංශු එකතු වී මුල්ම ජල තටාක ඇතිවීම පටන් ගත්තා. ඒ වන විට පෘථිවි ගර්භයේ ද්‍රව ආකාරයක් පැවතියත් එහි මතුපිට පිට වැස්මක් ඇති වීමට අවශ්‍ය තරම් සිසිල් වී පැවතියා. එම නිසා වර්තමානයේ අපට හැකියාව ලැබී තිබෙනවා එසේ පැමිණි ජලය ප්‍රයෝජනයට ගන්නත් ඒවා පානය කරන්නත්. අද වන විට පෘථිවිය තුළ ඇති සෑම දිය කඩිත්තකම, සෑම සාගරයකම, හැම ඇළ, දොළ, ගංගාවකම පිරී ඇති සෑම ජල බිඳුවක්ම වසර බිලියන ගණනාවක් පැරණියි. ඒවා සමහරවිට අප වෙත ළඟා වීමට පෙර උල්කාපාතයක් ඇතුළතත් සැතපුම් මිලියන ගණනාවක් ගමන් කොට තිබෙන්නට ඇති.

කෙසේ නමුත් ඒ වන විටත් අපේ පෘථිවියේ තත්වය අතිශය භයානකයි. සුළඟ පවා පැවතියේ ඉතා වේගවත්වයි. ග්‍රහලෝකයේ පරිභ්‍රමණය නිසා හැමවිටම අද පවතින චණ්ඩ මාරුතවලට වඩා විශාල කුණාටු පවා නිර්මාණය වුණා.

ඒ වගේම ඒ වන විට චන්ද්‍රයා පෘථිවියට ඉතා සමීපවයි පැවතියේ. එහි ගුරුත්ව බලය විසින් පෘථිවියේ ජල තටාක තුළ විශාල උදම් රළ නිර්මාණය කළා. නමුත් කාලයත් සමඟම චන්ද්‍රයා පෘථිවියෙන් ඈතට ගමන් කරන්න වුණා. එම නිසා ගුරුත්ව තරංග සංසුන් වී පෘථිවියේ භ්‍රමණ වේගයද අඩුවුණා.

මීලඟ forward කලාපයෙන් අප සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ වසර මිලියන 3800කට පෙර පෘථිවියේ ස්වභාවයයි.

# 'දෙවියන්' මැවූ මිනිසුන්

මානව සමාජයේ පරිණාමය පිළිබඳ අවබෝධයක් නොතිබූ යුගයක මිනිසුන්ව මවනු ලැබුයේ දෙවියන් විසින් යැයි මිනිසුන්ම විශ්වාස කළහ. විවිධ ආගමික ඉගැන්වීම් නිසාවෙන් අදටද මෙවන් විශ්වාසවලින් අන්ධව සිටින පිරිස් අපට හමුවෙයි. නමුදු සත්‍ය නම් මිනිසා විසින් දෙවියන් නිර්මාණය කිරීමයි. ඉඳින් මිනිස් මනසේ නිර්මාණශීලී පරිකල්පනයේ අපූර්වත්වය පිළිබඳ හොඳම උදාහරණය වන්නේ දෙවියන්ය. මිනිසා විසින් තම මනසේ ගොඩනැගුණු සංකල්පයක් වන දෙවියන්ව තමා දැන සිටි, තම රුවට සමාන ලෙස අපූර්වත්වයකින් යුතුව අතිශයෝක්තියට නංවාලමින් මැවීය. මෙලෙසින්ම සුරදූතිකාවන්ද දෙවඟනන් මෙන්ම යක්ෂයන්ද නිර්මාණය කළේය. ඒවා මැවීමේදී ද මිනිසා විසින් යොදාගනු ලැබුවේ සොබාදහමේදී තමන් අත්දකින ලද ප්‍රපංචයන්මය. සත්‍ය නම් සොබාදහම තුළ මිනිසා අත්දකින ලද මිනිස් රූප සහ සත්ව රූප අතිශයෝක්තියට නැගීමෙන් දෙවියන් නිර්මාණය කිරීමයි. එලෙසින්ම මිනිස් හෝ සත්ව රූප රෞද්‍ර හා භයංකාර ලෙස අතිශයෝක්තියට නැගීමෙන් යක්ෂයින් නිර්මාණය කිරීමයි.

මිනිස් මනසේ නිර්මාණය වූ මෙම සංකල්ප කලාකරුවෙකුගේ තෙලිතුඩින් සිතුවමක් බවට පත්විය. ඒ අනුව අවසාන විග්‍රහයේදී දෙවියන් මවනු ලැබුවේ කලාකරුවන් විසින් යැයි පැවසුවහොත් එය නිවැරදිය. අතීතයේදී දෙවියන්ව මැවූ මිනිස්සු ඒ ඒ කාර්යයන් සඳහා ද වෙන වෙනම දෙවිවරු මැවූහ. මෙය වැඩිපුරම යුරෝපයේදී දක්නට ලැබුණි. ඒ අතර මුලින්ම බහුදේව ඇදහිලි ඇති විය. එහි



ප්‍රමුඛස්ථානය වූයේ ග්‍රීසියයි. යුද්ධයට අධිපති, ප්‍රේමයට අධිපති මෙන්ම පොළව, අහස, ගින්න, හා ජලය ආදී බොහෝ දේ සඳහා ද අධිපති දෙවියන් එකල නිර්මාණය කළේය. මෙලෙසින්ම ඉන්දියාව මූලික කරගත් ආසියානු කලාපයේද දෙවිවරුන් රැසක් නිර්මාණය වූ අතර එහිදී කලාවට අධිපති දෙවඟනක් ද නිර්මාණය කරගන්නා ලදී. සරස්වතී ලෙස නම් කරන ලද්දේ මෙම දෙවියන්ය. මෙහිදී පැහැදිලිවම සරස්වතී දෙවඟන යනු කලාවේ අපූර්ව නිර්මාණයක් මිස කලාව යනු සරස්වතී දෙවියන් විසින් නිර්මාණය කරන ලද්දක් නොවන්නේය.

කලාකරුවා සරස්වතී දේවියව නිර්මාණය කරනු ලැබුවේ වීණාවක් අතැතිව නෙලුම් මලක් මත වැඩ සිටිනා කෙනෙකු ලෙසින්ය. කලාකරුවන් ඇයව වීණාවක් අතැතිව සිටින නිසා 'වීණාධාරි' ලෙසත් නෙලුම් මලක් මත වැඩසිටිනා නිසා 'කමලවාසිනී' ලෙසත් රූමත් සිරුරක් ඇති නිසා 'චාරුදේහිනී' ලෙසත් හැඳින්වීය. එසේම සරස්වතිය යනු අපූර්ව කලාත්මක සංකලනයක් වුවත් ඒ තුළ අන්තර්ගතව ඇත්තේ විඥානවාදී අදහසක් බැවින් එය කලාවට හෝ සමාජයට හෝ සේවය කරන්නේ නැත.

එසේම කලාකරුවා යනු සරස්වතී හෝ වෙනත් දෙවිකෙනෙකුන්ගෙන් වරම් ගත්, සමාජයට ඉහළින් වැජඹෙන කෙනෙකු නොව, මිනිසුන් අතරින්ම බිහිවූ සෞන්දර්යාත්මක පරිකල්පනයේ වැඩි හැකියාවක් ඇති තවත් මිනිසෙකුම වන්නේය. කලාකරුවා පොදු මිනිසාගෙන් වෙනස් වන කෙනෙකු වුවද ඔහු දෙවියන්ගේ විශේෂ දායාදයක් ද නොවන්නේය. හුදෙක්ම ඔහුගේ හෝ ඇයගේ මොළයේ ඇති සෞන්දර්යාත්මක පරිකල්පනයේ වැඩි හැකියාව මත කලාකරුවෙකු වන්නේය. සමහරුන් පවසන පරිදි කලාකරුවා තුළ පවතින විශේෂ සෞන්දර්යාත්මක හැකියාව ඔහුට දෙවියන්ගෙන් ලද දායාදයක් නැත්නම් පෙර ආත්ම භවයකින් රැගෙන එන දෙයක් නොවන්නේය.

මිනිස් සිරුර සෑදී ඇත්තේ විවිධ ඉන්ද්‍රියන්ගෙනි. ඒ ඒ ඉන්ද්‍රියන්ට පැවරෙන විශේෂ කාර්යයක්ද තිබේ. සාමාන්‍යයෙන් මිනිසුන් සියලුදෙනාගේම සෑම ඉන්ද්‍රියකම ක්‍රියාකාරීත්වය සමාන වන අතර විශේෂත්වයක් ලෙස සමහර අයෙකුගේ විවිධ ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරීත්වයේ විශේෂත්වයන් මත විවිධ හැකියාවන් අත්පත් කරගනී. එය ස්වභාව ධර්මයේ යථාර්ථය වන අතර එසේ නොවන කිසියම් බාහිර අද්භූත බලයක ප්‍රතිඵලයක් නොවේ. ඒ කෙසේද යත් මිනිසුන් සියලු දෙනාටම දිවීමට හැකි වුවත් හුසේන් බෝල්ට් හට වඩාත් වේගයෙන් දිවිය හැක. ඒ ඔහුගේ විශේෂ හැකියාව පුහුණුව මඟින් ප්‍රගුණ කර ගැනීම නිසායි. තවද අප සියලුදෙනාටම දේවල් මතකයේ තබාගත හැකි අතර සමහර පුද්ගලයින් හට වැඩිපුර දේවල් මතකයේ රඳවා ගැනීමට හැකිය. එයින්ද ඉහත කී කරුණ වඩාත් හොඳින් තහවුරු වනනේය. කෙසේ වුවද මේ සියලු හැකියාවන් පොදු දේ අතර වන විශේෂයන්ය. කලාවේ හැකියාවද එසේය. එය මිනිස් මොළයේ චින්තනයේ විශේෂයකි.

කලාකරුවා යනු දෙවියන්ගෙන් වරම් ලබා හෝ සංසාර පුරුද්දට හෝ බිහිවන කෙනෙක් නම් සෞන්දර්ය විශ්වවිද්‍යාලයක සිසුන්ට කලාව ඉගැන්වීම නිෂ්ඵල දෙයක් විය යුතුය. එහෙත් සැබවින්ම එය එසේ නොවේ. කලා විෂයන් උගන්වා ප්‍රගුණ කළ හැකිය. ඒ සෑම මිනිසෙකු තුළම කලාවට ඉඩක් පවතින නිසායි. එබැවින් දෙවියන් විසින් අප හට ලබාදෙන කිසිවක් නොමැති අතර අප සතු හැකියාවන් ප්‍රගුණ කිරීමෙන් පමණක් විශේෂත්වයන් අත්පත් කරගත හැකිවනු ඇත.

මේ ආණ්ඩුව 04 පිටුවෙන්

නායකත්වය සහිත රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමය වගේම චන්දන සූරියආරච්චි සහෝදරයා නායකත්වය දෙන රැකියාලාභී උපාධිධාරීන්ගේ සංගමයත් අපිත් එක්ක එකතු වෙලා ඉන්නවා. ඒ වගේම මීට පෙර සටනේදීත් විශාල කාර්යභාරයත් කරපු, ඒ සටන ජයග්‍රහණය කිරීම වෙනුවෙන් වෙසෙස වුණු සමාජවාදී තරුණ සංගමයත් අපිත් එක්ක මේ සටනට එකතු වෙලා ඉන්නවා. ඒ නිසා මේ සටන අපි තනිව, හුදකලාව කරන සටනක් නෙවෙයි.

## මේ සටන දිනන්න පුළුවන්ද?

ඔව් සහතික ලෙසම අපි මේ සටන දිනනවා. අපි මේ සටන පටන්ගත්තේ ජයග්‍රහණය කරන්න තමා. අපි එහෙම කියන්නේ මේ සටන උපාධිධාරීන්ට උපාධිය රැක දීම වෙනුවෙන්ම කරන සටනක් නොවන නිසා. මෙය මේ රටේ අනාගත පරම්පරාවේ අධ්‍යාපන අයිතිය වෙනුවෙන් කරන සටනක්. ඒ නිසා අපේ අරමුණ පටු නැහැ. ඒ විතරක් නෙවෙයි මේ සටන වෙනුවෙන් එකතු වෙලා ඉන්න සංවිධාන කියන්නේ සටන මඟදී අත්හැරලා යන, පාවාදෙන සංවිධාන නෙවෙයි. ඒ නිසා සහතිකයි අපි මේ සටන ජයග්‍රහණයෙන් කෙළවර කරනවා. ඒ වගේම අපි දන්නවා මේ ආණ්ඩුව හිස කඳින් වෙන්වුණු දුර්වල අණ්ඩුවක් කියලා. ඒකත් මේ සටන ජයග්‍රහණය කිරීමට අමතර වාසියක් වෙනවා.

## මොනවද මේ ආණ්ඩුවෙන් ඉල්ලන්නේ?

මේ වෙද්දි උපාධිධාරීන් 40350 රැකියා ලබා දීලා තියනවා. මෙයින් බාහිර උපාධිධාරීන් විදිහට රැකියා ලබාගත්ත 60 දෙනෙක්ව මුල්ම පත්වීම් ලබාගත්ත දවසෙම එළියට දාලා තියනවා. ඒත් ඒ කප්පාදුවෙනුත් බේරිලා ආයතනවල වැඩකරන්න ගියපු අපේ සහෝදර සහෝදරියන්ටත් ලියුම් ගහලා රැකියාවලින් එළියට දාන තැනට ඇවිත් තියෙනවා. අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලන පළමු ඉල්ලීම තමයි පත්වීම් ලැබී තිබියදිත් මෙසේ ඉවත්කරන ලද සියලුම බාහිර උපාධිධාරීන්ට එම පත්වීම් නැවත ලබාදෙන්න කටයුතු කරන්න කියලා. අපේ දෙවන ඉල්ලීම අභ්‍යන්තර හෝ බාහිර භේදයකින් තොරව සියලු උපාධිධාරීන්ට රැකියා ලබාදීම. තුන්වන ඉල්ලීම තමා උපාධිධාරීන්ට රැකියා ලබාදීමේදී යොදා තිබෙන වයස 35 කියන




සීමාව සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න කියන ඉල්ලීම. ඒ වගේම බාහිර උපාධි අපේක්ෂිත ශිෂ්‍යයින්ට පනවපු සීමාව ඉවත් කරන්න, ඒ කියන්නෙ 2016/13 චක්‍රලේඛය වහාම අහෝසි කරන්න කියන ඉල්ලීම්. මේ ඉල්ලීම් හතර පදනම් කරගෙනයි අපි මේ සටන කරගෙන යන්නේ.

## ඔබ බාහිර උපාධිධාරීන්ට හා ශිෂ්‍යයින්ට දෙන පණිවිඩය මොකක්ද?

අපි බාහිර උපාධිධාරීන්ට හා ශිෂ්‍යයින්ට කියනවා, ඔබ එකතු වෙන්න, මේ සටන ජයග්‍රහණය කරන්න ඕනා. මේක ඔබගේ අරමුණ, ඔබගේ පුද්ගලික ජීවිතය මෙන්ම අනාගතය පිළිබඳ ප්‍රශ්නයක්. අපි ඔබෙන් ඉල්ලනවා, මේ සටනේ කොටස්කරුවෙක් වෙන්න කියලා. අපි මේ සටන ජයග්‍රණය කළ යුතුයි. ඒ නිසා අපි බාහිර උපාධිය අපේක්ෂිත ශිෂ්‍යයින්ට, බාහිර උපාධිය ලත් විද්‍යාර්ථයින්ට කියනවා, ඔබ ඉතාම ශක්තිමත්. මේ රැකියා විරහිත උපාධිධාරීන් හැටදාහෙන් ඔබ විශේෂ පංගුවක්. ඔබ මෙම සමාජයට සේවය කරන්න ඉන්න පිරිසක්. ඔබේ ශක්තිය, ධෛර්යය ඔබ තේරුම් ගන්න ඕනා. ඒ නිසා එය තේරුම් අරගෙන මෙම සටනට මැදිහත් වෙන්න කියලා අපි ඉල්ලනවා. බාහිර උපාධිධාරීන්, අභ්‍යන්තර උපාධිධාරීන්, ශිෂ්‍යයින්, දෙමාපියන්, ගුරුවරුන් හා තරුණ තරුණියන් ලෙස අපි කවුරුත් පාරවල් කීපයක ඇවිත් මේ සටන වෙනුවෙන් දැන් එක හතරමං හන්දියකට ඇවිත් ඉන්නවා. අපිට තියෙන්නේ දැන් එක සටනක් එක අරමුණක්, මේ බීරි අලියෙක් වගේ ඉන්න ආණ්ඩුවට ඇහෙන්න ලොකු සද්දයක් ඕනා. ඒකට දැන් අපිට හයිය තියනවා. ඒ නිසා අපේ ශක්තිමත් සටනට එකතු වෙන්න, සටන් කරන්න එකතු වෙන්න කියලා ඔබෙන් ඉල්ලනවා.

## ජනතාවට අලුත් පාරක්



නුවරඑළිය ප්‍රාදේශීය සභාවට අයත් කිරිමැටියවත්ත ජනතාවගේ ප්‍රධාන අවශ්‍යතාවයක් වන පඩිපෙළ බොහෝ කාලයක සිට භාවිතා කිරීමට නොහැකි ලෙස අබලන්ව පැවතිණි. සමාජවාදී තරුණ සංගමයේ නුවරඑළිය දිස්ත්‍රික් බලමණ්ඩලයේ කාරකසභික, ජනතා විමුක්ති පෙරමුණේ නුවරඑළිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහී සහෝදරයාගේ මැදිහත්වීමෙන් ප්‍රාදේශීය සභාව මඟින් වෙන් කරන ලද රු. 150,000ක මුදලින් සදා නිමකරන ලද එම කිරිමැටියවත්ත පඩිපෙළ පසුගිය දා ජනතාව අතට පත් කෙරිණි. පඩිපෙළ සදා නිම කිරීම සඳහා ගම්වාසීන් සියලු දෙනාගේම ශ්‍රම දායකත්වය ලබාදුන් අතර මෙම පඩිපෙළ දැනට කිරිමැටියවත්තේ පවුල් 175ක ජනතාවට සහ පාසල් දරුවන් 800ට පමණ ගමනාගමන පහසුකම් සපයයි.

## ගමේ ගැටලු සභාවට



මාතලේ ප්‍රාදේශීය සභාවට අයත් පල්ලේපොළ වාවනාවත්ත ග්‍රාමයේ ජනතාව මුහුණ දෙන පොදු ගැටලුවලට විසඳුම් ලබාගැනීමේ අරමුණින් සමාජවාදී තරුණ සංගමයේ දිස්ත්‍රික් සාමාජික, ජනතා විමුක්ති පෙරමුණේ මාතලේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමින්ද කුමාර කෝනාර සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් හා වාවනාවත්ත පාරිසරික හා ප්‍රජා සංවර්ධන සංවිධානයේ මැදිහත්වීමෙන් සංවිධානය කරන ලද සුහද හමුවක් පසුගිය දා පැවැත්විණි. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් පිරිසක් සහ ගම්වාසීන් දෙසීයකට අධික පිරිසක් සහභාගී වූ අතර එහිදී ගමේ ප්‍රධානම ගැටලුව වන කසළ ප්‍රතිචක්‍රීයකරණ ගැටලුව නිරාකරණය කිරීමට, වැසි දිනයන්හි නිවාස හා වතු හරහා අක්‍රමවත් ලෙස ජලය ගලා යාම වැළැක්වීමට මෙන්ම ගමේ වෙනත් සංවර්ධන කටයුතු පිළිබඳවද විවිධ යෝජනා කෝනාර සහෝදරයා විසින් ඉදිරිපත් කෙරිණි.

## ජනතා මුදල් ජනතා සේවයට




කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රිනී, සමාජවාදී තරුණ සංගමයේ කොළඹ දිස්ත්‍රික් බලමණ්ඩලයේ කාරක සභික සිත්ති නබිලා හම්සා සහෝදරියගේ ප්‍රධානත්වයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නැගෙනහිර කොළඹ ආසන බලමණ්ඩලය විසින් "සුව දිවිය" ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද වෛද්‍ය සායනයක් පසුගියදා කිරුළපන සිද්ධාර්ථපුර ප්‍රජා ශාලාවේදී පැවැත්විණි. මෙම ව්‍යාපෘතිය කොළඹ මහ නගර සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ වැටුප් දායකත්වයෙන් සිදුකෙරෙන අතර අතිසාර්ථක ලෙස ප්‍රථම වැඩසටහන අවසන් විය. ඉදිරියටත් මෙම ව්‍යාපෘතිය යටතේ විවිධ ප්‍රදේශවල වෛද්‍ය සායන පැවැත්වීමට සැලසුම් කර ඇති බව නබිලා සහෝදරිය ප්‍රකාශ කර සිටියා ය.

## බද්දේගම ජනතාවට ආණ්ඩුවෙන් බොරු ඉඩම් ඔප්පු



බද්දේගම ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකතුමාගේ සංවිධානයෙන්, නිවාස අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතාගේ හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් අතිඋත්කර්ෂවත් ලෙස සංවිධානය කර තිබූ ඉඩම් ඔප්පු දසලක්ෂයක් ලබාදීමේ උත්සවයක් පසුගිය දා බද්දේගම ක්‍රීඩා පිටියේදී පැවැත්විණි. නමුත් අධික වියදමක් දරා පවත්වන ලද උත්සවයේ දී ජනතාව වෙත ලබා දී තිබුණේ "ඉඩම් ඔප්පුව" ලෙස සටහන් කරන ලද කවරයක බහාලූ " ඉඩම් ඔප්පුවක් ලැබීමට නියමිතයි" යනුවෙන් සටහන් කරන ලද පත්‍රිකාවක් පමණි. සමාජවාදී තරුණ සංගමයේ ගාල්ල දිස්ත්‍රික් බලමණ්ඩලයේ උප සභාපති, ජනතා විමුක්ති පෙරමුණේ බද්දේගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිමුතු නවින්ද්‍ර සහෝදරයා විසින් ප්‍රාදේශීය සභාව තුළදී මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කර තිබුණි. එහිදී එහි විපක්ෂ නායකයා විසින් කියා සිට ඇත්තේ එය රියදුරු බලපත්‍රය ලබාදීමට පෙර ලබාදෙන තාවකාලික රියදුරු බලපත්‍රයට සමාන බවයි. එවිට දිමුතු සහෝදරයා විසින් එම පත්‍රිකාව තාවකාලික බලපත්‍රයක් නම් එය බැංකුවකට හෝ යම් කෙනෙකුට පැවරීම කළ හැක්කේ කෙසේද හා ඔප්පු ලබා දීමේදී මීට නොදෙවනි උත්සවයක් සංවිධානය කළ යුතු නොවේද යනුවෙන් ප්‍රශ්න කිරීමේදී විපක්ෂ නායකතුමා නිරුත්තරව අසුන් ගත්තේ ය.



# නව ජීවිතයක් සඳහා බලාපොරොත්තුව

2016 වසරේදී පැවැත්වූ 59 වන වර්ල්ඩ් ප්‍රෙස් ෆොටෝ තරඟාවලියේදී ලොව හොඳම පුවෘත්ති ඡායාරූප 25ක් තෝරා ගැනුණි. එහි ප්‍රථම ස්ථානය දිනාගනු ලැබුයේ මෙහි දක්වා ඇති ඡායාරූපයයි.

මේ සඳහා රටවල් 128ක් නියෝජනය කරමින් ඡායාරූප ශිල්පීන් 5775 දෙනෙකු විසින් ඡායාරූප 82951 ක් ඉදිරිපත් කර තිබුණි. ඉහත ඡායාරූපය නම්කර තිබුණේ "නව ජීවිතයක් සඳහා බලාපොරොත්තුව" යනුවෙනි.

සිරියානු ජාතික පියෙක් තම කුඩා පුතු අතැතිව සිරියා - හංගේරියා දේශසීමාව හරහා හංගේරියාවට ඇතුළු වීමට බලා සිටින දර්ශනයක් කැමරා ඇසට ග්‍රහණය කරගෙන තිබුණි.

අමානුෂික ධනවාදයේ හා අධිරාජ්‍යවාදීන්ගේ උවමනාවන් සංතර්පණය කිරීම සඳහා බිහිවන්නා වූ යුද්ධයන්හි ප්‍රතිඵලය වනුයේ අසරණ සරණාගතයන් සීඝ්‍ර ලෙස වර්ධනය වීමයි. ඔවුන් තමන්ගේ ජීවිතයේ නව බලාපොරොත්තු සොයමින් වෙනත් රටවලට නීති විරෝධීව සංක්‍රමණය වීම වර්තමානයේ සුලබ දසුනකි.

එහෙත් කුසට අහරක් නොමැතිව, තම මූලික අවශ්‍යතාද ඉටුකරගත නොහැකිව සරලවම කිවහොත් මිනිසාගේ හුස්ම ගැනීමේ නිදහසටද අවසරයක් නොමැතිව කුහක ධනවාදය තුළ නව බලාපොරොත්තුවක අරුණලු බිහිවේ ද?

ඉදින් අප කළ යුත්තේ සමස්ත සමාජ ක්‍රමයම වෙනස් කිරීම විනා පැලැස්තර විසඳුම් ඇලවීම නොවන බව මෙම සරණාගතයින්ගේ ජීවිතවල ඇති ඛේදවාචකයන්ගෙන්ම ඔප්පු වී හමාරය.

# Women's Leadership Camp 2018




## බාහිර උපාධිධාරීන් මානව හිමිකම් යයි



බාහිර උපාධිධාරීන්ගේ පත්වීම් ලබාදීමේ දී ඇති වූ ගැටලුව මුල්කර ගනිමින් ඊට එරෙහිව පෙත්සමක් බාරදීම හා නිහඬ විරෝධයක් පසුගිය 26 වන දා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරිපිටදී පැවැත්වීය. මෙය බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුව විසින් සංවිධානය කර තිබුණි. ඒ සඳහා සමාජවාදී තරුණ සංගමය, රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමය, බාහිර උපාධි ශිෂ්‍ය බලමණ්ඩලය, බාහිර උපාධි ආචාර්ය සංසදය, රැකියාලාභී උපාධිධාරී සංගමය, ලංකා ගුරුසේවා සංගමය හා බාහිර උපාධි සුරැකීමේ දෙමව්පිය සංගමය ද එක් විය. මෙහි දී බාහිර උපාධි සුරැකීමේ සංවිධාන එකතුවේ කැඳවුම්කරු මහේෂ් අබේපිටිය සහෝදරයා හා උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි සහෝදරයා විසින් අදහස් දැක්වීය.

## ග්‍රීසියේ තරුණ උළෙලට SYU හා SSU නියෝජනයක්



ග්‍රීසියේ කොමියුනිස්ට් තරුණ සංගමයේ 44වන අන්තර්ජාතික තරුණ උළෙල පසුගිය සැප්තැම්බර් 21 දින ග්‍රීසියේ ඇතැන්ස් නුවර දී පැවැත්වීය. ඒ සඳහා සමාජවාදී ශිෂ්‍ය සංගමය සහ සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් මධූ කල්පනා සහෝදරිය සහභාගී වූවාය. මේ සඳහා රටවල් 40කින් පමණ වාමාංශික, ප්‍රගතිශීලී සංවිධාන රාශියක් සහභාගී විය. මෙහි දී මාක්ස්වාදය පිළිබඳ පැවති සම්මන්ත්‍රණයේදී මධූ සහෝදරිය විසින් අදහස් දැක්වීය. එසේම දකුණු කොරියාව, ඇල්බේනියාව, පින්ලන්තය, පෝලන්තය හා ස්විඩනය ඇතුළු රටවල් සමඟ ද්වීපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීමට හැකි වීමද විශාල ජයග්‍රහණයක් විය.

## සුහද ක්‍රිකට් තරඟය කෑගල්ලේ දී



සමාජවාදී තරුණ සංගමයේ කෑගල්ල දිස්ත්‍රික් බලමණ්ඩලය විසින් සංවිධානය කළ සුහද ක්‍රිකට් තරඟයක් පසුගිය 24 වන දා රඹුක්කන අශෝක කරුණාරත්න ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. මේ සඳහා ප්‍රදේශයේ ක්‍රිකට් කණ්ඩායම් රාශියක් ද සහභාගී වූ අතර තරඟාවලිය ඉතා සාර්ථකව පැවැත්වූ බවත් ඊට විශාල තරුණ පිරිසක් සහභාගී වූ බවත් දැනගන්නට තිබේ.

## සුරකිමු සොබා... අනාගතය උදෙසා..



"සුරකිමු සොබා... අනාගතය උදෙසා.." යන්න තේමා කරගනිමින් දුන්හිඳ ප්‍රදේශයේ පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රම මෙහෙයුමක් පසුගිය සැප්තැම්බර් 16 වන දින පැවැත්වීය. මෙය දුන්හිඳ සහෘදයෝ සංවිධානයේ මූලිකත්වයෙන් සමාජවාදී තරුණ සංගමය හා ඉහළ ඌවේ පරිසර මිතුරෝ සංවිධානය එක්ව සංවිධානය කළහ. මේ සඳහා එම සංවිධානවල නියෝජිතයින් හා ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල පිරිසක් එක් වූහ.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.